

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2017

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை

JANATHA ESTATES DEVELOPMENT BOARD

දර්ශනය

ප්‍රාදේශීය මට්ටමින් හොඳම මැදරට පාරම්පරික තේ නිෂ්පාදකයාවීම මගින් ඉහළම ශුද්ධ අලෙවි මිලක් ලබාගැනීමෙන් ලාභ ලබන හා ශක්තිමක් රාජ්‍ය ආයතන අතරින් එකක් බවට පත්වීමයි.

මෙහෙවර

උපරිම කැපවීමකින්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින්, පුද්ගල නිපුණතාවයන් සංවර්ධනයට වැඩි සැලකිල්ලක් දක්වමින්, කණ්ඩායම් ක්‍රියාකාරිත්වය හරහා අරමුණු කරා ළඟාවීම තුලින්, කර්මාන්ත අභිවෘද්ධියේ ප්‍රතිලාභ සමස්ථ රටටම හිමිකර දීමයි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව - 2017

පටුන

1. ආයතනික තොරතුරු 01
2. සභාපතිතුමාගේ පණිවිඩය 02
3. සංවිධාන ව්‍යුහය 03
4. ආයතනයේ පසුබිම සම්බන්ධ තොරතුරු 04
5. අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ තොරතුරු 05
6. ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්හි කළමනාකරණ කණ්ඩායම සම්බන්ධ තොරතුරු 06-07
7. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා 08– 11
8. ආයතනය සම්බන්ධ අනෙකුත් තොරතුරු හා වතුයායන්හි ආකර්ෂනීය ස්ථාන පිළිබඳව විස්තරය 12-16
9. ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර 17
10. වාර්ෂික ගිණුම් ප්‍රකාශ සහ ගිණුම්කරණ සටහන්
    1. ශේෂ පත්‍රය 18
    2. ආදායම් වාර්තාව 19
    3. මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 20-21
    4. මුල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 22-32
11. ගිණුම්කරණ ප්‍රතිපත්ති 33-46
12. විගණකාධිපතිගේ වාර්තාව 47-65
13. විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතනය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග 66-67

තැපැල් ලිපිනය : නො.55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02
දුරකථන අංකය : 011-4752759
ෆැක්ස් අංකය : 011-2446577
විද්‍යුත් ලිපිනය : info@jedb.lk
වෙබ් අඩවිය : www.jedb.lk

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2017

ආයතනික තොරතුරු

නම : ජනතා වතු සංවර්ධන මණ්ඩලය

නෛතික ස්වභාවය : 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පණතේ සඳහන් කාර්‍යය සඳහා එම පනත යටතේ වූ අංක 199/1/එම් හා 1976 පෙබරවාරි 06 දින දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලදී.

ලියාපදිංචි කාර්යාලය : නො. 55/75, වොක්ෂොල් පටුමග, කොළඹ 02.

විගණකවරු : විගණකාධිපති

බැංකුකරුවෝ : ලංකා බැංකුව
මහජන බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

අධ්‍යක්ෂකවරු

: කීර්ති බණ්ඩාර කොටගම මහතා	- සභාපති
: තරික් ඕමාර් මහතා	- විධායක අධ්‍යක්ෂක
: නිරූපමා කරුණාරත්න මිය (ජනවාරි සිට පෙබරවාරි දක්වා)	- ක්‍රියාකාරී අධ්‍යක්ෂක
: බෙවන් පෙරේරා මහතා (මාර්තු සිට)	- ක්‍රියාකාරී අධ්‍යක්ෂක
: නිලු විජේදාස මහතා	- අධ්‍යක්ෂක
: ආනන්ද ගාල්ලගේ මහතා	- අධ්‍යක්ෂක
: එස් එම් දයාරත්න මහතා	- භාණ්ඩාගාරික නියෝජිත

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2017

සභාපතිතුමාගේ පණිවිඩය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

වතු අංශය

හෙක්ටයාර් 2935.81 ක තේ වගාවක් හා හෙකටයාර් 367 ක රබර් වගාවක් ආයතනය සතුව පවතී.

තේ අස්වැන්න

2017 වර්ෂය සඳහා ලබා ගත් නිමි තේ අස්වැන්න කිලෝ ග්‍රෑම් 1,444,526 ක් වේ. මෙය පසුගිය වර්ෂයට (2016) වඩා කි.ග්‍රෑ. 130,436 ක ප්‍රමාණයක වැඩිවීමක් දක්වයි. මෙම තත්වයට හේතු වූයේ යහපත් කාලගුණික තත්වයක් යටතේ අඛන්ඩව පොහොර යෙදීම, තේ ගස් වෙත දියර පොහොර ඉසීම හා කාබනික පොහොර භාවිතා කිරීමයි.

මෙහිදී පහැදිලි වූ කරුණක් වන්නේ නියමිත ඇස්තමේන්තුගත ක්‍රියාවලියට අනුරූපව පොහොර යොදා ගතහොත් ඇස්තමේන්තුගත ප්‍රමාණය වැඩිකර ගැනීමට හැකියාවක් ඇති බවයි.

නිෂ්පාදන වියදම - තේ

මෙම වර්ෂය සඳහා නිෂ්පාදිත තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වියදම වාර්තා වන්නේ රු. 588.08 කි. කෙසේ වෙතත් මෙම වියදම වූ පසුගිය වසරේ කිලෝ ග්‍රෑමයක් සඳහා නිෂ්පාදන වියදම වූ රු. 602.81 ට වඩා අඩු අගයක් ගනී.

විකුණුම් මිල

නිමි තේ කිලෝ ග්‍රෑමයක් සඳහා මෙම වර්ෂයේ රු. 428.40 ක මුදලක් ලබා ගැනීමට හැකි විය.මෙය පසුගිය වසරේ ලබා ගත් රු. 326.61 ට වඩා වැඩි අගයක් විය. මෙම වර්ෂය තුලදී තේ මිලෙහි වෙනසක් දක්නට ලැබිණි. කෙසේ වෙතත් ජනවසම සතු දැනට ක්‍රියාත්මක තේ කම්හල් 4 සඳහා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවන් සිදු කිරීම හා හොඳ තත්වයේ දළු සැපයීමෙන් මෙම කම්හල්වල විකුණුම් මිල තවදුරටත් දියුණු කල හැක.

රබර් වගාව

නිෂ්පාදනය

මෙම වර්ෂය සඳහා රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 379,092 ක් විය. මෙය පසුගිය වර්ෂයේ ලබා ගත් අස්වැන්න වූ කි.ග්‍රෑ. 322,691 ට සාපේක්ෂව වැඩිවීමක් ඇතිවීම නිසා නිෂ්පාදනයේ සුලු වැඩිවීමක් පෙන්නුම් කර ඇත. ඉහත කරුණු අනුව නිෂ්පාදනයේ වැඩිවීමට හේතු වූයේ යහපත් කාලගුණික තත්වය සහ පොහොර යෙදීම ආදී කරුණු නිසාය.

විකුණුම් මිල

වර්ෂය අවසානයේ ලැබූ විකුණුම් මිල වූයේ කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 302.24 කි. මෙම කාල සීමාව සඳහා වෙළඳපොලේ රබර් මිල යහපත් තත්වයක පැවතිනි. මෙය අප වතුවලට වාසිදායක තත්වයක් විය.

ප්‍රධාන කාර්යාලයේ ආදායම

මෙම වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලයේ ආදායම රු. 82,057,703/- ක් විය. එම ආදායම් අතරට බදු ආදායම්, ගොඩනැගිලි කුලී ආදායම් ඇතුලත්ය.

පාරිභෝගික අංශයේ විකුණුම් ආදායම

ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික අංශය රු. 335,121,617/- ක පිරිවැටුමක් අත්පත් කර ගත් අතර එම ඉපයීම 2016 වසර හා සැසඳීමේදී රු. 318,416,415/- ක වැඩිවීමක් පෙන්නුම් කරයි.


ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සාර්ථකත්වය පිණිස ලබා දුන් සහයෝගය හා මග පෙන්වීම වෙනුවෙන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාටත් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහ ජනවසම සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පල කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

විංග් කමාන්ඩර් බුවනෙක ඩී අබේසුරිය (ශ්‍රී.ල.ගු.හ. - විශ්‍රාමික)
සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ආයතනික සැලැස්ම


ජනතා වතු සංවර්ධන මණ්ඩලය

(2011.08.03 දිනැති ලිපිය මගින් අනුමත)



ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පසුබිම සම්බන්ධ තොරතුරු

1975 දී බලාත්මක වූ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) නීතිය මගින් සමාගම සතු සියලුම වැවිලි ඉඩම් රජයට පවරා දෙන ලදී. මෙම වතු ජනසතු කිරීමත් සමඟ වතු කළමනාකාරිත්වය තරමක් පුළුල් වූ අතර, එම ඉඩම් කළමනාකරණ ආයතන කිහිපයකට පවරා දී ඇත.



ජනසතු කිරීමට පෙර වතු කිහිපයක් කළමනාකරණය කළ “ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව” (SLSPC) ට අමතරව රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1976 දී 1972 අංක 11 දරණ පනත මගින් “ජනතා වතු සංවර්ධන මණ්ඩලය” (JEDB) නමින් නව ආයතනයක් නිර්මාණය කරන ලදී. මෙම සංවිධාන දෙකට අමතරව ජනසතු කරන ලද වතු කළමනාකරණය කිරීම සඳහා නව ආකාරයේ සංවිධාන නිර්මාණය කරන ලදී. මෙම ආයතන තුල “උසවසම” (උඩරට සමූපකාර වතු සංවර්ධන මණ්ඩලය) ජනාවාස ඇතුළත් විය.

කළමණාකාර ආයතන කිහිපයක් අතර ඉඩම් බෙදාදීම තේ වගා ක්ෂේත්‍රයේ කළමනාකාරිත්වයේ දැඩි පසුබැමකට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනය පහත වැටීම, නාස්තිය සහ අකාර්යක්ෂමතාව වැනි අවාසි රැසක් ඇති වූ බවට තර්කයක් ඇත.

එබැවින් මෙම ඉඩම් ප්‍රතිසංස්කරණයේ ක්ෂණික බලපෑම තේ කර්මාන්තයට හිතකර නොවීය.

මෙම තත්ත්වය හමුවේ 1977 බලයට පත් රජය තේ කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා කළමනාකරණ ව්‍යුහයන් සහ භාවිතයන් ඒකාබද්ධ කිරීමට පියවර කිහිපයක් ගත්තේය.ඒ අනුව උසවසම , ජනාවාස සහ මැතිවරණ සමුපකාර අහෝසි කිරීම සහ මෙම සංවිධාන විසින් කළමනාකරණය කරන ලද සියලුම දේපල ජනවසම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පැවරීම සිදු විය.

මෙම ප්‍රධාන කළමනාකාර ආයතන දෙක 1980 සිට වෙන වෙනම අමාත්‍යාංශ දෙකක් යටතට ගෙන එන ලද අතර ඒවායේ කළමනාකරණ ව්‍යුහයන් ද ප්‍රාදේශීය ශාකා හරහා විමධ්‍යගත කරන ලද අතර එමඟින් ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් කලාපවලට නිදහස සහ තීරණ ගැනීමේ බලතල ලබා දෙන ලදී

1984 පමණ වනවිට රුසියානු වෙළඳපල මගින් ඉහළ ඉල්ලුමක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේ සඳහා ඉදිරිපත් කිරීම නිසා 1984 සහ 1985 යන වර්ෂයන් තුල ඉහළ ලාභදායී තත්වයක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ලබාගන්නා ලදි. එවකට මෙම වර්ෂයන් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ප්‍රදානයක්ද සිදුකර ඇත.

පසුව 1987 – 1988 පසු රටේ පැවති අයහපත් වාතාවරණය සහ දේශපාලන තත්වයන් හේතුකොට ගෙන ජනවසම දැඩි ලෙස පසුබෑමකට පත්විය. මේ තත්වය යටතේ 1989 – 1990 පමණ වනවිට දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණපෑමට සිදුවිය. එසේ හෙයින් මෙම පසුබෑම හමුවේ ජනවසම 1992 වර්ෂයේ ප්‍රතිව්‍යුහගතකරණයකට ලක්කොට වැවිලි සමාගම් 22 කට මෙම වතුයායන් 242 ක් බදු පදනම මත ලබාදෙන ලදි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2017

අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ තොරතුරු

1.	කීර්ති බී කොටගම මහතා	-	සභාපති
2.	තරික් ඕමාර් මහතා	-	විධායක අධ්‍යක්ෂ
3.	නිලූපමා කරුණාරත්න මෙනවිය (ජනවාරි සිට පෙබරවාරි දක්වා)	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
4.	බෙවන් පෙරේරා මහතා (මාර්තු සිට)	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
5.	නිලූ විජේදාස මහතා	-	අධ්‍යක්ෂ
6.	එස් එම් දයාරත්න මහතා	-	භාණ්ඩාගාර නියෝජිත

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2017

ප්‍රධාන කාර්යාලය කළමනාකරණ කණ්ඩායම සම්බන්ධ තොරතුරු

01. ලලිත් අබේකෝන් මහතා : වැඩබලන සාමාන්‍යාධිකාරී

(ජනවාරි සිට නොවැම්බර් දක්වා)

02. එම් ෂෙරීප් මහතා : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

03. එම් සී ප්‍රේමතිලක මහතා : කළමනාකරු - ප්‍රවාහන නඩත්තු

04. කේ ජේ ටී බී රාජසුරිය මහතා : ගණකාධිකාරී - වතු

05. එන් රණසිංහ මිය : ගණකාධිකාරිනී - ප්‍රධාන කාර්යාලය

06. උපුල් සිරිවර්ධන මහතා : කළමනාකරු - මානව සම්පත්
(මාර්තු සිට)

07. නාමල් විජේතුංග මහතා : වැඩබලන කළමනාකරු - වන සම්පත් හා ඉඩම්

08. අසේල රාජපක්ෂ මහතා : කළමනාකරු - නීති

09. රොහාන් බඹරදෙනිය මහතා : කළමනාකරු - ප්‍රාදේශීය කාර්යාලය

10. ක්‍රිෂ්මී නානායක්කාර : අභ්‍යන්තර විගණක

11. සුනිල් රාජපක්ෂ මහතා : සහකාර අභ්‍යන්තර විගණක

12. එස් ඒ එල් පෙරේරා මහතා : සහකාර ගණකාධිකාරී

13. එච් ජී අනුර මහතා : සහකාර කළමනාකරු - අලෙවි

14. කේ ඒ එන් පෙරේරා මහතා : සහකාර කළමනාකරු - නඩත්තු

15. චන්දිමා රැටියල මිය : සහකාර කළමනාකරු - ප්‍රවාහන

16. ඩබ්ලිව් ජී පී වාද්දුවගේ : සහකාර කළමනාකරු - අලෙවි

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2017

වතුයායන්හි කළමනාකරණ කණ්ඩායම සම්බන්ධ තොරතුරු

වතුයාය	භාර කළමනාකරු	භෝගය	ප්‍රමාණය	තැපැල් ලිපිනය
බෝපිටිය/ ග්‍රේට්වැලි	කේ ජී එස් කොස්සින්න මහතා	තේ	786.11	දෙල්තොට
බෝහිල්	ඒ එම් ඩී අයි රාජකරුනා මහතා	තේ	472.01	කැටුබුල
දෙල්තොට	පී රාජපක්ෂ මහතා	තේ	410.10	ගලහ
ගලබොඩ	ඒ බී ඩි ආර් කුමාර	තේ	752.75	ගලබොඩ
හන්තාන	නිශාන්ත රාජ් මහතා	තේ	1405.63	නුවර
හෝප්	එන් එස් අතුකෝරළ	තේ	654.00	හේවාහැට
කන්දල්ඔය	බී ඩී එස් එල් පෙරේරා මහතා	තේ	989.93	නාවලපිටිය
කොලපතන	සී බන්ඩාර මහතා	තේ	381.00	නාවලපිටිය
ලෙවලන්	සී ඩි අළුවිහාරේ මහතා	තේ	1254.92	පුපුරුස්ස
ලුල්කන්දුර	ඩී සී කොඩිතුවක්කු මහතා	තේ	1050.03	දෙල්තොට
මහවිල	හර්ෂ කුමාර මහතා	තේ	283.15	උලපනේ
මවුන්ට්ජීන්	එච් එම් එස් ඩී හුනුගල මහතා	තේ	301.67	වටවල
නාගස්තැන්න	ඒ එස් දයාරත්න මහතා	තේ	506.42	නාවලපිටිය
රහතුන්ගොඩ	ජී ජී පුලසිංහ මහතා	තේ	478.14	හේවාහැට
රුක්වුඩ්	අයි එම් ඒ ඩී ඉලංගකෝන් මහතා	තේ	429.67	හේවාහැට
කුමාරවත්ත	ඒ එස් සේතුංග මහතා	රබර්	1822.46	මොනරාගල
පලෙයි	එස් එච් සමරසිංහ මයා	පොල්	682.19	යාපනය
(මෙම වතුයාය 2017.08.28 වන දින සිට අවුරුදු 30 ක බදු පදනම මත ජා.පශු ස. ම වෙත ලබා දී ඇත)				
තෙලිපොතැන්න/ දියලුම	ඩබ්ලිව් ඒ ඒ කේ විජේසුරිය	රබර්	354.34	කොස්ලන්ද

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව - 2017

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

විගණන කමිටු රැස්වීම් වාර්තාව

ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා මූල්‍ය වාර්තා කරන පද්ධතිය හා පාලනයන් කාර්යක්ෂමව කරගෙන යාමට අභ්‍යන්තර විගණනය හා බාහිර විගණන අංශයන්ගෙන් නිර්දේශ ක්‍රියත්මක කිරීම හා පසු විපරම් කටයුතු කිරීම

කමිටුවේ සංයුතිය

ස්වාධීන විධායක අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් මෙය සමන්විත වන අතර, මණ්ඩලයේ අරමුණු හා කාර්යයන් විධිමත්ව යන පාලනයෙන් යුතුව පවත්වාගෙන යාමට මෙම කමිටුව ස්ථාපිත කර ඇත.

එස් එම් දයාරත්න මහතා	:- සභාපති (මහා භාණ්ඩාගාර නියෝජිත)
ගාල්ලෙ ආරච්චි මහතා	:- විධායක ස්වාධීන අධ්‍යක්ෂ
කේ.ජී.පී. කුමාර මහතා	:- රජයේ විගණන අධිකාරී
ක්‍රිෂ්මි නානායක්කාර මිය	:- කැදවුම්කරු (අභ්‍යන්තර විගණක ජනවසම)

යොමුවීම

මණ්ඩලයේ සම්පත් (රාජ්‍ය දේපල) සැකසුරුවම් ලෙස හා කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම ව්‍යාපෘති වැඩසටහන් සැලසුම් වලට අනුව ක්‍රියාත්මක වන බවට තහවුරු කර ගැනීම අභ්‍යන්තර විගණකගේ හා බාහිර විගණකාධිපති වාර්තාවල ප්‍රධාන ගැටලු හඳුනාගෙන නිවැරදි කර මග පෙන්වමින් හා වත්කම් කලමනාකරණය ඉහල නංවාලීම.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම්

වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වා ඇති අතර, එය පහත පරිදි වේ.

නම	2017	2017	2017
එම් දයාරත්න මහතා	V		V
ගාල්ලේ ආරච්චි මහතා	V		V

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

<u>විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2017 වර්ෂය</u>

1. **<u>රාජකාරී පැවරුම් ලබා දීම - සියලුම අංශ</u>**
   ආයතනයේ සියළුම සේවකයන් හට රාජකාරී පැවරුම් ලබා දිය යුතු අතර දැනටමත් ගණකාධිකාරීවරුන් හට රාජකාරී පැවරුම් ලබා දී ඇති බවත් අනෙකුත් සේවකයන් හට ඉක්මණින් පැවරුම් ලබා දීමට කටයුතු කරන ලෙස දැන්වීම.

2. **<u>වාර්ෂික ගිණුම් අනුමත කිරීම හා විගණනයට ඉදිරිපත් කිරීම</u>**
   වාර්ෂික ගිණුම් අනුමත කිරීමට විගණන හා කළමනාකරන කමිටුවට බලයක් නොමැති බවත් එය අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කොට අනුමැතිය ලබා ගත යුතු බව නියෝජ්‍ය විගණකාධිපති අවධාරනය කරන ලදී.
   නිසි ආකාරයෙන් සියලු ඇමුණුම් සමග වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

3. **<u>ණය හිමි ණය ගැති ලේඛණය</u>**
   මෙතෙක් පිළියෙල කර නොමැති බැවින් පිළියෙල කර රජයේ විගණන අංශයට භාර දෙන ලෙසට පවසන ලදී.

4. **<u>ස්ථාවර වත්කම් ලේඛණය</u>**

   මෙතෙක් පිළියෙල කර නොමැති මෙය මාස දෙකක් ඇතුලත පිළියෙල කල යුතු බවට දන්වන ලදී. වටිනාකම් නොමැතිව හෝ ලේඛණයක් සකසා ඒ ඒ අංශ වල වත්කම් ප්‍රධානීන් විසින් පවත්වාගෙන යා යුතු බවත් අවසානයේ වත්කම් තහවුරු කල යුතු බවත් දැන්වීම.මෙහි වගකීම මුල්‍ය අංශය සතුය.
   භාවිතයට ගතහැකි වත්කම් පිරිවැය පමණක් ප්‍රත්‍යාගණනය කරන ලෙසත් ක්ෂය කර ඇති වත්කම් ඉවත් කරන ලෙසත් කඩිනමින් මෙය සිදු කිරීම.

<u>කොළඹ නගරයේ බදු දී ඇති ඉඩම්</u>

5. **<u>මිස්ටර් පේන්ට් ආයතනය</u>**
   මේ සම්බන්ධ නඩුවක් පවතින බවත් තීන්දුව ලැබුණ පසු ඉදිරි පියවර ගන්නා බව

6. **<u>නිලෝනා ලංකා ආයතනය</u>**
   2010 වසරේදී කරුණු සාකච්ඡා කර ඇති බවත් පසුගිය වසර 04 ද නිසි ලෙස බදු ගෙවා නැති බවත්,ලෙටර් ඔප් ඩිමාන්ඩ් හැකි ඉක්මණින් ඔවුන් වෙත යැවිය යුතු බවය.

7. **<u>මැග් සිටි ආයතනය</u>**
   දැනට වාරණ නියෝගයක් පවතින බවත් උසාවි නියෝගයකින් එය අවලංගු කර නිසි කටයුතු සිදු කල යුතු බව

8. <u>ඇල්කඩුව වැව්ලි සමාගම</u>
   මෙම ආයතනයට බදු දී ඇති කාර්යාල පරිශ්‍රය සඳහා බදු ගිවිසුමක් නොමැති බවත් නව ගිවිසුමකට එළඹිය යුතුය.

9. <u>අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් සම්බන්ධයෙන්</u>
   සියළු වතුවල අනවසර භුක්ති විඳින ඉඩම් සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ඉඩම් වපසරියද සමගින් සකස් කර කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

10. <u>ආයතනයේ සේවක ගැටළු</u>
    <u>කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි නිළධාරීන් තිදෙනා පිළිබඳව</u>
    මෙම නිළධාරීන් තිදෙනා මේ වන විටත් ඉවත් කර ඇත. නීති කළමනාකරු හට මාස 03 ක වැටුප් ගෙවා ගැටළුව නිරාකරණය කර ඇත.

11. <u>හමුදාවන්ට තේ සැපයීම</u>
    මෙම කාර්යය සාර්ථක කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව සම්පූර්ණ සහාය ලබා දුන් බවත් එබැවින් මෙම කාර්යය සාර්ථක වූ බව පවසන ලදී.

12. <u>අක්‍රිය කර්මාන්ත ශාලා</u>
    ජනවසම සතු කර්මාන්ත ශාලා 13 න් 4ක් පමණක් ක්‍රියාත්මක වන බවත් ඉතිරි කර්මාන්ත ශාලාද අලුත්වැඩියා කර නිෂ්පාදන කාර්යයට ගත යුතු බව දැන්වීය.

13. <u>අමු තේ දළු විකිණීම</u>
    ප්‍රතිපත්තියක් ලෙස අමු තේ දළු පිටත විකිණීම නතර කල යුතු බවට දැන්වීය.

14. <u>හන්තාන තේ කර්මාන්ත ශාලාව</u>
    හන්තාන තේ කර්මාන්ත ශාලාවේ වර්තමාන තත්වය සහ එය වසා දැමීම පිළිබඳව වාර්තාවක් සකස් කර කමිටුවට ඉදිරිපත් කල යුතු බව දැන්වීය.

15. <u>විගණන විමසුම් පිළිබඳව</u>
    පිළිතුරු නොදුන් විමසුම් සඳහා හැකි ඉක්මණින් පිළිතුරු ලබා දී ඊලග කමිටුවට ඉදිරිපත් කිරීම.

16. <u>විගණන ගාස්තු සම්බන්ධව</u>
    විගණන දෙපාර්තමේන්තුවට අප ආයතනයෙන් රු. ලක්ෂ 21 ක් පමණ ගෙවීමට ඇති බවත් එය ගෙවීමට කටයුතු කල යුතු බවත් කමිටුව තීරණය කිරීම.

17. <u>අභ්‍යන්තර විගණන වාර්තා</u>
    ගලබොඩ වතුයායේ විගණන වාර්තාව වතු අධිකාරීවරයා වෙත යවා එහි කරුණු පිළිබඳව විමසිය යුතු බවත් පසුව අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කල යුතු බවටත් දැන්වීය.

18. <u>අභ්‍යන්තර විගණන සැලැස්ම</u>
    චක්‍රලේඛයට අනුව එය සකස් කර අනුමත කර ගැනීම.

19. **<u>උපදේශකවරු පත් කිරීම හා වර්තමාන සාමාන්‍යාධිකාරී විගණන අධිකාරී</u>**
නව උපදේශකවරු පත් කිරීම් වලට අදාළව අනුමැතිය ලබා ගත් ආකාරය හා ඔවුන්ගේ රාජකාරී ලැයිස්තු පිළිබඳව විමසන ලදී.
උපදේශක-උපදේශකවරු පත් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් පමනක් තිබෙන බව පැවසීය.

20. **<u>වතුයායන් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂකවරයෙකු පත් කිරීම</u>**
වතුයායන්වල ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කර වාර්තා ලබා ගෙන ඒවා කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

21. අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැර තනතුරු වන උපදේශකවරුන් පත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම.
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල අනුමැතිය සම්බන්ධ ප්‍රගතිය වාර්තා කිරීම.

22. වැඩබලන සාමාන්‍යාධිකාරීවරයෙකු පත් කර ආයතනයේ මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීම. වර්තමානයේ සිටින උපදේශක කම පත් කරන්නේ නම් කැබිනට් අනුමැතිය ලබා ගැනීම.
අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති HM ශ්‍රේණියට මානව සම්පත් කළමනාකරු සහ නීති කළමනාකරු බඳවා ගැනීමට මහා භාණ්ඩාගාරයේ හා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම හා එහි ප්‍රගතිය වාර්තා කිරීම.
MM ශ්‍රේණිය සඳහා නිල වාහන දීමනාව හිමි නැතත් ආයතනයේ සිටින සියළුම MM කාණ්ඩයේ නිළධාරීන් එය ලබා ගන්නා අතර මේ සඳහා නිසි අනුමැතිය අමාත්‍යාංශයෙන් ලබා ගැනීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2017

වතුයායන් පිළිබඳ තොරතුරු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායන් ප්‍රධාන කාණ්ඩ 04කට බෙදා වෙන්කර ඇත.

කණ්ඩායම්

i.	හේවාහැට	තේ
ii.	ගලහ	
iii.	නාවලපිටිය	
iv.	කුමාරවත්ත තෙලිපතැන්න	රබර්

කණ්ඩායම්වල සාරාංශය


	රිකිලි තේ	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	හිස් ඉඩම්
තේ	1,214.65	944.48	636.79	718.49	1,189.65


	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	හිස් ඉඩම්
රබර්	291.40	25.81	217.29	129.20

i. හේවාහැට සමූහය


හේවාහැට නිම්නය පැරණිම තේ වගාවට හිමිකම් කියන පළාත වේ. ලූල්කඳුර වතුයාය ශ්‍රී ලංකාවේ පළමුවරට වාණිජ බෝගයක් ලෙස තේ වගා කල ආදර්ශ වතුයාය වේ.

හේවාහැට සමූහයේ වතුයායන් 04 පහත පරිදි වේ.










වතුයාය	රිකිලි තේ	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	නිස් ඉඩම්
ලූල්කඳුර	130.50	221.15	-	89.75	19.00
හෝප්	81.25	109.75	58.00	88.32	16.00
රුක්වුඩ්	64.24	217.48	-	28.47	8.50
රහතුන්ගොඩ	64.73	19.96	87.06	34.93	-
එකතුව	**340.72**	**568.34**	**145.06**	**241.47**	**43.50**

ii. ගලහ සමූහය

පහත දක්වා ඇති වතුයායන් 05 මෙම සමූහය යටතේ දැක්වේ.




වතුයාය	රිකිලි තේ	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	හිස් ඉඩම්
ලෙවලන්	129.80	231.25	118.00	-	8.29
ග්‍රේට්වැලි	37.44	14.39	26.25	30.50	130.63
හන්තාන	111.14	3.16	196.12	138.05	109.57
බෝපිටිය	39.75	23.50	-	23.75	-
දෙල්තොට	50.80	21.25	61.62	77.75	73.00
එකතුව	**368.93**	**293.55**	**401.99**	**270.05**	**321.49**

* බෝපිටිය සහ ග්‍රේට්වැලි වතුයායන් ඒකාබද්ධ කර ඇත.

iii. නාවලපිටිය සමූහය

පහත සඳහන් කර ඇති වතුයායන් මෙම සමූහය යටතේ වේ.


















වතුයාය	රිකිලි තේ	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	හිස් ඉඩම්
කොළපතන	94.00	38.50	-	46.00	13.00
බෝහිල්	55.00	-	20.75	26.50	108.50
කන්දල්ඔය	52.30	24.59	8.00	56.20	-
නාගස්තැන්න	72.60	-	25.50	63.23	163.60
ගලබොඩ	88.40	19.50	-	24.45	402.12
මහවිල	85.82	-	-	-	-
මවුන්ට් ජින්	56.88	-	35.49	17.59	137.44
එකතුව	**505.00**	**82.59**	**89.74**	**233.97**	**824.66**

iv. රබර් වතුයායන්

පහත සඳහන් කර ඇති වතුයායන් මේ යටතේ දැක්වේ.



වතුයාය	හොඳ බීජ පැල	ආන්තික බීජ පැල	අඩු බීජ පැල	හිස් ඉඩම්
කුමාරවත්ත	282.78	23.81	147.29	-
දියළුම	8.62	2.00	70.00	129.20
එකතුව	**291.40**	**25.81**	**217.29**	**129.20**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තා 2017

ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් පිළිබඳ විස්තර

(01) සේවකයින්ගේ සමාජ තත්වය වර්ධනය කිරීම සඳහා මෙය ප්‍රධාන සාධකයක් ලෙස අප සලකන බැවින් වැවිලි මානව සංවර්ධන භාරයේ සහාය ඇතිව, ගෘහස්ථ මුදල් කළමනාකාරිත්වය පිළිබඳව සියලුම කම්කරුවන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

(02) වතු ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා පරිගණක පුහුණු පාඨමාලා පවත්වා සේවක දැනුම ප්‍රගුණ කොට ඒමගින් පලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

(03) වතුවල සේවයේ නියුතු සුභසාධක හා ලමා සංවර්ධන නිළධාරීන්ට තම රාජකාරී කටයුතු සම්බන්ධයෙන් වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) මගින් පුහුණුවීම් පාඨමාලා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව පැවැත්වීම.

(04) ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයට හඳුන්වා දුන් Sage 50 මෘදුකාංග ගිණුම්කරණ පද්ධතිය ගැන අවබෝධ කරලීම සඳහා පුහුණු පාඨමාලා ඒම ගිණුම් අංශයේ නිළධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පැවැත්වීම.

(05) වතු කාර්ය මණ්ඩලවල ගිණුම් කටයුතු වලට සම්බන්ධ වී සිටින සේවකයින් වෙනුවෙන් නව Sage 50 මෘදුකාංග ගිණුම්කරණ පද්ධතිය ගැන අවබෝධ කරලීම සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදි.

(06) සහකාර වතු අධිකාරීවරුන් වෙනුවෙන් ජාතික වැවිලි කළමනාකරණ අයතනය මගින් පවත්වනු ලබන විවිධ කළමනාකාරිත්ව පාඨමාලා වලට සහභාගි කරවා ඔවුන්ගේ දැනුම ඉහල නැංවීමට කටයුතු කිරීම.

(07) සුළු පරිමාන හා මහා පරිමාන තෙන්ඩර් මණ්ඩල සාමාජිකයින්ට ව්‍යක්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වනු ලබන වැඩමුලු වලට සහභාගිවීමට අවස්ථාව ලබා දීම.

(08) වැවිලි සංවර්ධන මානව භාරය මගින් විවිධ පුහුණු පාඨමාලා පවත්වා ඒමගින් සේවක දැනුම ප්‍රගුණ කොට ඒමගින් ආයතනයේ නිෂ්පාදනය හා පලදායිත්වය ඉහල නැංවීමට කටයුතු කිරීම

(09) ගිණුම් සිද්ධාන්ත වලට අනුව ගිණුම් පිලියෙල කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ සංගමය විසින් මෙහෙයවන ලද වැඩමුළුවලට මුදල් අංශයේ නිළධාරීන් ආයතනය වෙනුවෙන් සහභාගිකරවීම.

(10) වතු සේවක සමුපකාර සමිතිවල ගිණුම් සැකසීම ආදී කටයුතුවල නියැලී සිටින ඒම ලිපිකරුවන් සඳහා වැවිලි මානව සම්පත් භාරය (PHDT) මගින් පවත්වනු ලබන වැඩමුළුවලට සහභාගිවීමට අවස්ථාව ලබා දීම.

(11) වතු වෛද්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව හා දැනුම වැවිලි මානව සම්පත් භාරය මගින් සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇතිව පැවැත්වීම.

(12) අර්ථසාධක කටයුතු සම්බන්ධයෙන් වාර්තා පිළියෙල කිරීමට අවශ්‍ය නිවැරදි තොරතරු ඒක්රැස් කිරීම හා වාර්තාකරණය පිළිබඳ වැඩිදුර පුහුණුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල හරහා වතු කාර්ය මණ්ඩලවලට ලබා දීමට කටයුතු කිරීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය

		2017.12.31	2016.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ	13	1,561,893,715	1,577,300,989
අස්පෘශ්‍ය වත්කම්	14	1,168,937	904,781
ජීව විද්‍යාත්මක වත්කම්	15	623,715,174	620,797,324
බදු වත්කම්		32,168,955	32,168,955
		2,218,946,780	2,231,172,049
ජංගම වත්කම්			
භාණ්ඩ ලැයිස්තුව	16	81,861,673	94,292,580
ලැබිය යුතු වෙළඳ හා වෙනත්	17	663,022,229	577,852,712
මුදල් හා වෙක්පත්	18	28,410,286	14,310,963
		773,294,187	686,456,255
මුළු වත්කම්		**2,992,240,968**	**2,917,628,305**
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධ			
ප්‍රාග්ධනය	19	3,670,000,000	3,670,000,000
සමුච්චිත අලාභ		(8,843,465,152)	(8,469,369,707)
		(5,173,465,152)	(4,799,369,707)
සංචිත			
ප්‍රාග්ධන සංචිත	20	2,776,220,129	2,782,868,702
පොදු සංචිත/රාජ්‍ය ප්‍රදාන	21	2,357,289,535	1,676,360,639
මුලු ස්කන්ධය		**5,133,509,664**	**4,459,229,341**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රසම්පාදනය	22	654,352,345	624,741,404
බැංකු ණය	23	55,506,609	100,867,027
		709,858,954	725,608,431
ජංගම වගකීම්			
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා	24	487,135,579	512,668,406
පොලී දරණ ණය ගැතියෝ	25	240,198,529	236,845,419
බදු ණය හිමියෝ	26	8,148,093	15,242,210
තැරැව්කාර අත්තිකාරම්	27	46,044,639	19,759,873
ගෙවිය යුතු වෙළඳ හා වෙනත්	28	521,540,287	595,183,624
සේ.අ.අ./ව.සේ.අ.අ./ල.හා.අ.අ.	29	792,027,827	906,154,103
ඩෙ.නි.හා.අ./වෙනත් ගෙවිය යුතු	30	6,445,405	32,367,337
තැන්පතු/බදු දේපල අත්තිකාරම්	31	163,973,403	137,069,289
බැංකු අයිරා	32	56,823,741	76,869,978
		2,322,337,501	**2,532,160,239**
මුළු ස්කන්ධය හා වගකීම්		**2,992,240,968**	**2,917,628,305**

ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව ජනවසම අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම දරයි.
ජනවසම අධ්‍යක්ෂක මණ්ඩලය තවදුරටත් අනුමත කර අත්සන් තබා ඇත.

සභාපති අධ්‍යක්ෂක

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් වාර්තාව

	සටහන් අංක	31/12/2017 රු.	31/12/2016 රු.
ආදායම	5	1,099,303,454	494,938,120
විකුණුම් පිරිවැය	6	(1,333,232,569)	(893,804,173)
දල ලාභය		**(233,929,115)**	**(398,866,053)**
වෙනත් ආදායම්	7	82,057,703	76,650,747
		(151,871,412)	322,215,306
බෙදාහැරීමේ වියදම්	8	3,727,420	976,081
පරිපාලන වියදම්	9	80,964,828	26,825,392
සේවක වියදම්	10	110,731,080	105,544,232
වතුවල වෙනත් වියදම්	11	10,706,191	77,156,042
		206,129,519	210,501,747
මූල්‍ය වියදමට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		(358,000,931)	(532,717,052)
මූල්‍ය වියදම	12	23,021,592	31,243,961
බදු වලට පෙර ලාභය/(අලාභය)		(381,022,523)	(563,961,014)
ආදායම් බදු		-	-
වර්ෂයේ ලාභය		(381,022,523)	(563,961,014)
වර්ෂයේ සම්පූර්ණ ආදායම		(381,022,523)	(563,961,014)

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයට මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	31/12/2017	31/12/2016
	රු.	රු.
බදු වලට පෙර ලාභය	(381,022,523)	(563,961,014)
<u>ගැලපුම් සඳහා</u>		
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	29,610,941	32,213,221
ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන	-	(606,377)
ක්ෂයවීම්	21,282,875	32,732,929
ක්ෂයවීම් - ජීව විද්‍යාත්මක	24,340,262	-
මුල්‍ය වියදම	22,420,140	6,561,418
පොලී ආදායම්	(575,478)	71,130
ක්‍රමක්ෂය පිරිවැය	290,971	-
අධිභාරය - සේ.අ.අ., සේ.නි.අ. , පාරිතෝෂික	-	71,598,521
මෝටර් රථ විකිණීමෙන් ලද මුදල	(5,025,000)	-
කාරක ප්‍රාග්ධනය වෙන් කිරීමට පෙර මෙහෙයුම් ලාභය	**92,344,711**	**142,570,842**
	(288,677,812)	(421,390,172)
<u>අයිතම්වල වෙනස්කම් සඳහා කාරක ප්‍රාග්ධන</u>		
භාන්ඩ ලැයිස්තුව	12,430,908	(30,880,991)
වෙළඳ හා වෙනත් ලැබීම්	(85,169,516)	(20,078,969)
වෙළඳ හා වෙනත් ගෙවීම්	(73,643,337)	45,445,579
තැන්පතු සහ අත්තිකාරම්	26,904,114	21,637,390
සේ.අ.අ./වතු සේ..අ/ව.හා.සේ.අ.	(114,126,277)	71,191,140
සේ.නි.හා. සහ අනෙකුත් ගෙවීම්	(25,921,932)	-
තැරැව්කාර අත්තිකාරම්	26,284,766	(74,165,070)
පාරිතෝෂික ගෙවීම්	(25,532,828)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය	(258,774,102)	13,149,079
පාරිතෝෂික ගෙවිම්	-	-
ආදායම් බදු ගෙවිම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය	(547,451,914)	(408,241,093)
<u>ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය</u>		
කසල තේ විකිණීම	-	2,358,556
ලැබිය යුතු බදු කුලී	-	1,000,000
ක්ෂේත්‍ර සංවර්ධන වියදම්	-	(48,493,473)
ජීව විද්‍යාත්මක වත්කම් මිලදී ගැනීම	(27,258,111)	-
පොලී ආදායම්	575,478	-
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(555,127)	-

වාහන විකිණීමෙන් ලද ආදායම්	5,025,000	-
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(5,875,600)	(22,931,087)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුල්‍ය ප්‍රවාහය	(28,088,361)	(68,066,004)
මුල්‍ය ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය		
ණය සඳහා ආපසු ගෙවීම්	(45,360,418	(15,150,616)
පොලී දරණ ණය ගෙවීම්	3,353,110	3,806,490
ණයහිමි බදුකරුවෝ	(7,094,117)	(4,298,063)
මුල්‍ය වියදම	(22,420,140)	(2,479,352)
භාණ්ඩාගාර දීමනාව	679,300,000	511,689,820
රබර් සඳහා සහනාධාර දීමනාව	1,628,896	2,400,224
ප්‍රාග්ධන සංචිත	278,505	-
මුල්‍ය ක්‍රියාකාරකම් මගින් වූ මුල්‍ය ප්‍රවාහයන්	609,685,836	495,968,503
මුදල් හා මුදල් සමාන වටිනාකම්වල ශුද්ධ වැඩිවීම/අඩු වීම	34,145,561	19,661,406
ආරම්භක මුදල් හා මුදල් සමාන වටිනාකම	(62,559,016)	(82,220,422)
අවසාන මුදල් හා මුදල් සමාන වටිනාකම	(28,413,455)	(62,559,016)
අවසාන මුදල් හා මුදල් සමාන වටිනාකම විග්‍රහ කිරීම		
බැංකු ශේෂය - වතුයායන් සඳහා	12,931,959	889,257
ලංකා බැංකුව - 8624530	5,053,888	4,342,093
ස්ථීර තැන්පතු	4,022,540	3,651,833
ලංකා බැංකුව - 80669453	1,983,464	-
ලංකා බැංකුව - 75646976	1,568,677	91,647
ලංකා බැංකුව - 2164625	893,355	171,132
ලංකා බැංකුව - 2327555	684,892	4,248,162
අතැති මුදල්	610,840	178,853
මහජන බැංකුව - 014200183155909	281,196	270,188
මහජන බැංකුව - 014100103155909	139,771	139,771
අත ඇති මුදල් - ප්‍රාදේශීය කාර්යාලය	105,523	7,857
ලංකා බැංකුව - 034021	74,549	133,605
මාර්ගස්ථ මුදල්	53,926	174,859
මහජන බැංකුව - 003200100022296	3,917	11,705
ලංකා බැංකුව - යාපනය	1,791	-
බැංකු අයිරා		
ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327554	(49,422,534)	(65,540,328)
ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327553	(4,943,149)	(9,049,107)
මහජන බැංකුව - යුතියන් පෙදෙස 014100293155909	(2,457,103)	(2,279,589)
නේෂන්ස් ට්‍රස්ට් - 006100003643	(954)	(954)
	(28,413,455)	**(62,559,016)**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

		13/12/2017 රු.	31/12/2016 රු.
5.	**ආදායම**		
	අමු දළු සහ මිශ්‍ර කරන ලද තේ	520,978,068	404,455,324
	ජන තේ	335,121,617	16,705,202
	රබර් සහ වෙනත්	196,840,890	68,957,502
	අතුරු භෝග	45,852,751	3,715,584
	පොල්	510,127	1,104,509
		1,099,303,454	**494,938,120**
6.	**විකුණුම් පිරිවැය**		
	අමු දළු සහ මිශ්‍ර කරන ලද තේ	990,317,220	778,515,510
	ජන තේ	143,485,915	13,504,680
	රබර් සහ වෙනත්	196,236,401	92,916,151
	අතුරු භෝග	1,467,979	2,804,653
	පොල්	1,725,055	6,063,178
		1,333,232,569	**893,804,173**
7.	**වෙනත් ආදායම්**		
	ගොඩනැගිලි කුලී	42,863,392	10,041,700
	ඉඩම් බදු කුලී	27,981,200	44,541,880
	මෝටර් රථ ඉවත් කිරීමෙන් ලද මුදල	5,025,000	-
	විවිධ ලැබීම්	5,139,801	7,049,251
	ආරක්ෂක	472,832	1,967,832
	ණය/ ස්ථිර තැන්පතු පොලී	575,478	71,131
	දැව විකිණීමෙන් ලද ආදායම්	-	12,978,954
		82,057,703	**76,650,747**
8.	**බෙදාහැරීමේ වියදම**		
	ප්‍රවාහන ගාස්තු	2,329,878	5,500
	ඉදුම් හිටුම් වියදම්	422,852	22,285
	නොමිලේ ලබාදීම්	351,077	53,215
	ගමන් වියදම් හා යැපීම් දිමනා	285,364	55,913
	රක්ෂණය	74,599	-
	භාණ්ඩ පැටවීම් හා බෑමේ	67,879	2,200
	වෙළඳ ප්‍රචාරණ	66,049	-
	වෙළඳ බලපත්‍ර ගාස්තු	58,109	-
	වෙළඳ ප්‍රවර්ධනය	25,239	620,506
	ටෙන්ඩර් තැන්පතු	46,375	-
	පරිත්‍යාග	-	216,462
		3,727,420	**976,081**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

	2017.12.31	2016.12.31
	රු.	රු.
9. පරිපාලන වියදම්		
අධිභාරය -සේ ස්.අ.සා	28,573,486	
අධිභාරය පාරිතෝෂික	17,493,328	
වාහන ගාස්තු	5,220,665	2,285,000
ක්ෂය වීම්	3,306,738	3,793,909
වාහන සඳහා ඉන්ධන	3,527,463	2,766,017
විවිධ වියදම්	2,902,808	2,098,049
වරිපනම් සහ බදු	2,824,080	2,824,080
අධිභාරය සේ. අ.සා.අ	2,250,905	
විදුලි බලය	2,412,723	1,830,007
පුවත්පත් දැන්වීම් සඳහා	1,828,442	544,504
වාහන අළුත් වැඩියා නඩත්තු	1,658,186	1,382,473
දුරකථන හා අන්තර්ජාල ගාස්තු	1,635,245	977,124
පුහුණුවීමේ දීමනා	1,570,778	
ලිපි ද්‍රව්‍ය	1,433,933	1,122,930
සනීපාරක්ෂක සේවා	966,000	890,466
අධ්‍යක්ෂ ගාස්තු	623,000	206,670
කාර්යාල උපකරණ අළුත්වැඩියා	555,645	214,696
ජල ගාස්තු	412,685	266,791
ගොඩනැගිලි කාර්යාල නඩත්තු	397,701	4,051,561
අධිභාරය වතු .සේ.අ.සා	374,765	
ක්‍රම ක්ෂය	290,971	
මුද්දර ගාස්තු	167,049	123,538
පරිත්‍යාග	155,000	90,000
වායු සමීකරණ අළුත් වැඩියා	147,575	122,450
විගණන ගාස්තු	130,000	130,000
පුහුණු වීමේ වැඩමුලු සඳහා	54,976	234,494
පුවත්පත් හා සඟරා	45,680	47,574
තක් සේරු ගාස්තු	5,000	124,438
මැණුම් ගාස්තු		55,000
උපදේශණ ලබාගැනීමේ සේවා ගාස්තු		643,622
	80,964,827	**26,825,393**
10. කාර්ය මණ්ඩල වියදම්		
වැටුප් හා දීමනා	82,881,535	80,950,588
සේ.අ/ව.සේ.අ.සා/ව.සේ.හා	6,847,930	4,999,089
පාරිතෝෂිත ප්‍රතිපාදන	3,447,612	8,248,742
වෛද්‍යාධාර (විධායක නොවන)	3,464,233	2,419,407
කම්කරු ගාස්තු	2,954,656	2,588,332
වෛද්‍යාධාර (විධායක සේණි සඳහා)	1,909,466	1,245,333
අතිකාල දීමනා	1,846,573	873,570
සේ.නි.හා.අරමුදල	1,678,787	1,473,741
තේ සලාකය	1,252,191	1,194,383
කාර්ය මණ්ඩල සුභ සාධනය	3,186,170	675,835
පැමිණීමේ ප්‍රසාධ දීමනා	706,350	516,100
ගමන් වියදම් හා යැපීම් දීමනා	417,854	315,832
පසුම්බියෙන් කරනලද වියදම්	137,724	43,281
	110,731,081	**105,544,233**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

		13/12/2017	31/12/2016
		රු.	රු.
11.	**වතු වල වෙනත් වියදම්**		
	නෛතික වියදම්	10,116,582	-
	වන්දි ගෙවීම්	589,609	2,640,180
	අධිභාරය - වතු.සේවා.අ	-	77,453
	අධිභාරය - සේ.අ.සා	-	39,113,467
	අධිභාරය - සේ.නි.	-	2,885,549
	අධිභාරය - පාරිතෝෂික	-	29,305,572
	නෛතික වියදම්	-	3,133,821
		10,706,191	**77,156,042**
12.	**මූල්‍ය ගාස්තු**		
	බැංකු අයිරා පොලී	10,253,184	11,819,759
	බෝකර් අත්තිකාරම් සඳහා පොලී	8,156,989	8,778,983
	අනෙකුත් ණය සඳහා පොලී	3,579,800	4,082,067
	දඩ මුදල්	503,500	-
	බැංකු ණය සඳහා පොලී	291,504	2,479,352
	කල් බදු පොලී	138,663	
	බැංකු ගාස්තු	97,952	4,083,800
		23,021,592	**31,243,961**

13 දේපල පිරියත සහ උපකරණ

වත්කම් වලට අදාළ විස්තර	පිරිවැය			ක්ෂය කිරීම්			ලි.හැ.අ.	ලි.හැ.අ.
	2017.01.01 දිනට ශේෂය	වසර තුල එකතුව	2017.12.31 දිනට ශේෂය	2017.01.01 දිනට ශේෂය	වර්ෂය තුල	2017.12.31 දිනට ශේෂය	2017.12.31 දිනට ශේෂය	2016.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
1. වැඩි දියුණු නොකල ඉඩම්, පැවරූ පරිනත වැවිලි සහ වෙනත් වත්කම්	27,557,465		27,557,465	24,926,940		24,926,940	2,630,525	2,630,525
2. දියුණු කල ඉඩම්, මාර්ග හා පාලම්, ලයින් නිවාස හා වැසිකිලි, ගොඩනැගිලි, ගබඩා	1,620,868,485	487,964	1,621,356,449	145,239,812	3,570,280	148,810,092	1,472,546,358	1,475,628,674
3 යන්ත්‍ර සුත්‍ර, කාර්යාල උපකරන හා රථ වාහන	255,883,084	3,329,809	259,212,893	201,503,356	16,009,060	217,512,415	41,700,478	54,379,729
4. පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	3,910,934	2,652,262	6,563,196	1,543,708	858,920	2,402,629	4,160,567	2,367,226
5. ලී බඩු හා සවි කිරීම්	5,449,627	66,270	5,515,897	4,211,710	33,021	4,244,731	1,271,165	1,237,917
6. ජල සම්පාදන යෝජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අත්කම් නිවාස	16,597,190	383,160	16,980,349	5,198,234	811,593	6,009,827	10,970,522	11,398,956
7. ආරක්ෂිත විදුලි ආලෝකවල හා ගිනිසිරියා වගාව	655,482		655,482	436,088		436,088	219,394	219,394
8. ඔනුගල්ඔය වත්තේ ස්ථාවර වත්කම්, නොනිමි ප්‍රාග්ධන වැඩ	6,013,927		6,013,927				6,013,927	6,013,927
9. කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	23,424,641	-1,043,863	22,380,778				22,380,778	23,424,641
මුළු එකතුව	**1,960,360,835**	**5,875,602.00**	**1,966,236,436**	**383,059,848**	**21,282,874.00**	**404,342,722**	**1,561,893,714**	**1,577,300,989**

14 අස්පෘශය වත්කම්

වත්කම් වලට අදාළ විස්තර	පිරිවැය			ක්‍රම ක්ෂය			ලි.හැ.අ.	ලි.හැ.අ.
	2017.01.01 දිනට ශේෂය	වසර තුල ඒකතුව	2017.12.31 දිනට ශේෂය	2017.01.01 දිනට ශේෂය	වර්ෂය තුල	2017.12.31 දිනට ශේෂය	2017.12.31 දිනට ශේෂය	2016.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
මෘදුකාංග වියදම්	904,781	555,128	1,459,908		290,971	290,971	1,168,937	904,781
එකතුව	**904,781**	**555,128**	**1,459,908**		**290,971**	**290,971**	**1,168,937**	**904,781**

15 ජීව විද්‍යාත්මක වත්කම්

ධාරක වත්කම්

	පරිනත නොවූ වැවිලි					පරිනත වැවිලි					මුලු එකතුව
	තේ	රබර්	පොල්	අනෙකුත්	එකතුව	තේ	රබර්	පොල්	අනෙකුත්	එකතුව	
පිරිවැය											
2017.01.01 දිනට	59,813,907	162,990,937	708,526	8,473,906	231,987,276	347,936,799	101,863,673	1,071,944	8,203,624	459,076,040	691,063,315
වසර තුල එකතුව	103,350	26,089,199	23,068	185,270	26,400,887						26,400,887
වසර තුල මාරු කිරීම්	(12,806,524)	(25,410,852)			(38,217,376)	12,806,524	25,410,852			38,217,376	
දෙසැම්බර් 31 දිනට	**47,110,733**	**163,669,284**	**731,594**	**8,659,176**	**220,170,787**	**360,743,323**	**127,274,525**	**1,071,944**	**8,203,624**	**497,293,416**	717,464,202
ක්ෂය											
2017.01.01 දිනට						84,983,274	15,668,450			100,651,724	100,651,724
වසර තුල වෙන් කිරීම්						10,000,000	14,340,262			24,340,262	24,340,262
වසර තුල මාරු කිරීම්											
දෙසැම්බර් 31 දිනට						94,983,274	30,008,712			124,991,986	124,991,985
ලියා හැරිය අගය 31.12.2016	59,813,907	162,990,937	708,526	8,473,906	231,987,276	262,953,525	86,195,223	1,071,944	8,203,624	358,424,316	500,111,592
ලියා හැරිය අගය 31.12.2017	47,110,733	163,669,283	731,593	8,659,177	220,170,786	265,760,049	97,265,813	1,071,944	8,203,624	372,301,430	592,472,216

පරිභෝජන වත්කම්

	පරිනත නොවූ වැවිලි					පරිනත වැවිලි					මුලු එකතුව
	දැව	ඉඟුරු	කොසෙල්	අනෙකුත්	එකතුව	දැව	ඉඟුරු	කොසෙල්	අනෙකුත්	එකතුව	
පිරිවැය											
2017.01.01 දිනට	21,189,726	202,947			21,392,673	8,912,685		23,008	57,366	8,993,059	30,388,733
වසර තුල එකතුකිරීම්	857,225				857,225						857,223
වසර තුල මාරු කිරීම්	-11,991,255				-11,991,255	11,991,255				11,991,255	
	10,055,696	202,947			10,258,643	20,903,940		23,008	57,366	20,984,314	31,242,957

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

			31/12/2017	31/12/2016
			රු.	රු.
16.	**භාණ්ඩ තොගය**			
	යෙදවුම් ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය	16.1.	17,057,682	11,102,654
	නිෂ්පාදන භෝග	16.2.	61,732,053	80,256,602
	වර්ධක භෝග තවාන		3,071,938	2,933,324
			81,861,673	94,292,580
16.1.	**යෙදවුම් ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය**			
	ඇසුරුම් ද්‍රව්‍ය		8,770,340	1,784,970
	පොහොර		4,563,711	4,511,814
	යල් පැනගිය තොග		1,833,254	1,609,692
	විවිධ තොග		1,694,332	2,646,917
	ලිපි ද්‍රව්‍ය		196,044	549,261
			17,057,682	11,102,654
16.2.	**නිෂ්පාදිත භාණ්ඩ තොග**			
	තේ තොග		50,003,068	68,951,411
	රබර්		11,520,815	11,098,482
	විවිධ භෝග		208,169	206,709
			61,732,053	80,256,602
17.	**වෙළඳ හා වෙනත් ලැබීම්**			
	වෙළඳ ලැබීම්		363,896,686	224,492,798
	ශ්‍රී.ල.රා.වැ.ස. ණය මුදල සහ පොලිය		119,346,347	160,453,589
	විවිධ ණය ගැතියෝ	17.3.	89,781,610	94,567,347
	තැන්පතු හා පෙර ගෙවුම්	17.2.	29,034,165	27,281,350
	සේවක හා කම්කරු ලැබීම්	17.1.	30,347,996	40,465,451
	සංශෝධන		11,190,988	11,190,988
	අය කර ගතයුතු රදවා ගැනීමේ බදු		9,589,407	9,566,158
	වැවිලි සංවර්ධන ව්‍යාපෘති		4,136,733	4,136,733
	අය කර ගතයුතු වැට් බදු		3,521,614	3,521,614
	ක්වින්රිච් ඇග්‍රෝ පුද්ගලික සමාගම		2,176,683	2,176,683
			663,022,229	577,852,712
17.1.	**සේවක හා කම්කරු ලැබීම්**			
	උත්සව අත්තිකාරම්		21,344,112	20,950,303
	විවිධ ලැබීම්		7,125,342	5,367,058
	සමාජ සුභසාධන		1,241,303	2,357,514

වතු සේවක ණය ගැතියෝ (අය කර ගතයුතු)	501,029	11,647,367
විශේෂ අත්තිකාරම්	136,209	143,208
	30,347,995.57	40, 465,451.32

17.2. තැන්පතු හා පෙර ගෙවුම්

අත්තිකාරම්	22,582,879	22,146,828
තැන්පතු	5,840,972	4,960,052
පෙර ගෙවුම්	610,315	174,471
	29,034,165	27,281,350

17.3. විවිධ ණය ගැතියෝ

1. වතු පාලන ගිණුම	8,897,236	-
2. මොන්ට්ක්‍රිස්ටෝ වතුයාය	40,503,226	-
3. වෙනත්	34,739,812	86,376,104
4. සේ.අ.සා.(නීති ගිණුම)	2,938,093	-
5. මාතලේ වතු පාලන ගිණුම	902,935	-
6. යාපනය වතු පාලන ගිණුම	684,875	-
7. මුල්හල්කැලේ වතු පාලන ගිණුම	436,345	-
8. සේ. අ.සා. (නීති ගිණුම)	382,830	-
9. සේ.අ.සා.ගිණුම (අධි ගෙවීම 1996)	160,400	-
10. ජන තේ අපනයන ගිණුම	100,421	-
11. දියලුම වතු පාලන ගිණුම	20,317	-
12. ජන තේ පාලන ගිණුම	6,120	-
13. විවිධ ණය ගැතියෝ - වතු යායන්	- 8,191,243	
	89,781,610	94,567,347

18. මුදල් හා ද්‍රවශීල වත්කම්

වතු බැංකු ශේෂය	12,931,959	889,257
ලංකා බැංකුව 8624530	5,053,888	4,342,093
ස්ථීර තැන්පතු - හැටන් නැෂනල්/ මහජන බැංකුව	4,022,540	3,651,833
ලංකා බැංකුව 80669453	1,983,464	-
ලංකා බැංකුව - 75646976	1,568,677	91,647
ලංකා බැංකුව - 2164625	893,355	171,132
ලංකා බැංකුව - 2327555	684,892	4,248,162
අත ඇති මුදල්	610,840	178,853
මහජන බැංකුව - 103155909	281,196	270,188
මහජන බැංකුව - 183155909	139,771	139,771
අත ඇති මුදල් - ප්‍රාදේශීය කාර්යාලය	105,523	7,857
ලංකා බැංකුව 034021	74,549	133,605
මාර්ගස්ථ මුදල්	53,926	174,859
ලංකා බැංකුව - යාපනය	1,791	-
මහජන බැංකුව - 100022296	3,917	11,705
	28,410,286	**14,310,963**

		2017.12.31	2016.12.31
		රු.	රු.
19 **රජයේ ප්‍රාග්ධනය**			
ප්‍රාග්ධනය		3,670,000,000	3,670,000,000
		3,670,000,000	3,670,000,000
20 **ප්‍රාග්ධන සංචිත**			
ප්‍රාග්ධන සංචිත ගිණුම		1,965,050,475	1,965,050,475
ප්‍රාග්ධන සංචිත ප්‍රදාන		656,308,762	656,308,762
ඉඩම් විකිණීමෙන් ලද ආදායම් ගිණුම		149,193,311	148,914,807
වත්කම් විකිණීමෙන් ලද ලැබීම්		5,667,581	5,667,581
මෝටර් රථ විකිණීමෙන් ලද මුදල (ප්‍රදාන)			6,927,078
		2,776,220,129	2,782,868,703
21 **සාමාන්‍ය සංචිත/රාජ්‍ය ප්‍රදාන**			
ප්‍රදාන	21.	2,053,989,820	1,374,689,820
සාමාන්‍ය සංචිත		287,270,977	285,642,081
වැවිලි සංවර්ධන ව්‍යාපෘති		16,028,738	16,028,738
		2,357,289,535	1,676,360,639
21.1. **සාමාන්‍ය සංචිත**			
නව වැවිලි සහනාධාර සංචිත		7,459,578	5,830,681
සාමාන්‍ය සංචිත		55,280,753	55,280,753
වැවිලි මානව සංවර්ධනය		43,934	43,934
සාමාන්‍ය සංචිත ගිණුම		224,486,712	224,486,712
		287,270,977	285,642,080
22 **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්**			
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	19.1	654,352,345	624,741,404
		654,352,345	624,741,404
23 **බැංකු ණය**			
මහජන බැංකු ණය අංක 03 ගිණුම - 0102298		22,970,327	22,970,327
පෑන් ඒෂියා බැංකුව - 010063380119		32,536,283	69,536,283
ලංකා බැංකු ණය අංක - 712647723			8,360,418
		55,506,610	100,867,028
24 **ගෙවිය යුතු පාරිතෝෂික - පැරණි සේවකයින්**			
ගෙවිය යුතු පාරිතෝෂික - පැරණි සේවකයින්		487,135,579	512,668,406
		487,135,579	512,668,406
25 **පොලී දරණ ණය ගැනීම්**			
ගෙවිය යුතු වෙනත් ණය			
ඒස් ආර් ඒම් සී		131,571,131	131,191,331
හලාවත වැවිලි සමාගම		63,627,397	60,427,397
ශ්‍රී ලංකා තේ මණ්ඩලය		25,000,000	25,000,000
ලංකා මිනරල් සෑන්ඩ් සමාගම		15,000,000	15,226,690
පිගන් සංස්ථාව		5,000,000	5,000,000
		240,198,528	236,845,418
26 **බදු ණය හිමියෝ**			
බදු හිමියෝ		6,840,071	
මූල්‍ය බදු කුලී වෙන් කිරීම්		136,160	136,160
ඊ ඩබ්ලිව් ඉන්පෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ්		1,171,863	
අවිනිශ්චිත පොලී ගිණුම			15,106,051
		8,148,094	15,242,211

27 **තැරැව්කරු අත්තිකාරම්**

මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස්	36,299,149	16,609,439
නාවලපිටිය ප්ලාන්ටේෂන්	5,771,715	
ජෝන් කීල්ස්	1,708,260	
රත්වත්ත තේ කර්මාන්ත ශාලාව	1,500,000	1,500,000
සමර්විල් සහ සමාගම	744,136	744,136
ජේ ඩී සහ පුත්‍රයෝ (පුද්) සමාගම	21,379	21,379
ඉන්සයිට් පැක්ටරි (පුද්) සමාගම		884,918
	46,044,639	19,759,872

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

		2017/12/31	2016/12/31
		රු.	රු.
28.	**වෙළඳ හා වෙනත් ගෙවිය යුතු**		
	ගෙවිය යුතු වෙළඳ	124,170,872	87,317,758
	ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන	74,691,871	117,605,286
	ගෙවිය යුතු වැට් බදු	51,205,999	47,493,726
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	6,648,637	8,549,878
	ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	6,357,269	7,819,534
	විවිධ ණය ගැතියෝ	251,569,315	322,897441
	අන්තර් වතු පැවරුම්	3,332,395	-
	සේවක ප්‍රසාද දීමනා	2,879,784	3,107,837
	මුද්දර බදු	233,775	219,525
	උ.වි.ගෙ. බදු	195,186	172,638
	රහතුන්ගොඩවත්ත පාලන ගිණුම	255,184	-
		521,540,287	595,183,624
28.1.	**ගෙවිය යුතු වෙළඳ**		
	වෙනත්	81,961,378	3,736,848
	මහවැලි නිවාස ව්‍යාපෘතිය	36,310,518	36,310,518
	රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව	4,398,976	4,333,500
	ඒම් සී ඒම් මාකටින්	1,500,000	1,500,000
	රාජ්‍ය වැවිලි සංස්ථාව	-	41,107,242
	ඇල්කඩුව වැවිලි සමාගම	-	329,650
		124,170,872	87,317,758
28.2.	**ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන**		
	ගෙවිය යුතු වේතන	16,388,527	54,716,515
	නිවාඩු දින වැටුප්	27,678,532	27,654,478
	කාර්ය මණ්ඩල හා සේවක අඩු කිරීම්	21,143,800	23,136,440
	සේවක මණ්ඩල වෛද්‍යාධාර යෝජනා ක්‍රමය	7,717,979	8,016,656
	හිමිකම් නොපෑමේ වේතන	1,763,034	4,081,196
		74,691,871	117,605,286

28.3	**විවිධ ණය ගැතියෝ**		
	වෙනත්	94,844,832	225,015,231
	ආපසු දුන් තැන්පතු	57,987,031	63,313,167
	උපචිත වියදම්	15,684,657	17,352,768
	වෙළඳ ණය හිමියෝ	82,938,086	17,216,276
		251,454,606	322,897,411
28.3.1.	**වෙනත්**		
	ප්‍රාදේශිය කාර්යාල ගිණුම	13,828,888	-
	ප්‍රාදේශිය කාර්යාල අවිනිස්චිත ගිණුම	1,863,756	-
	ඉදිරියට කල ගෙවීම්	688,440	-
	ඒස් ඒන් සී ගෙවිය යුතු ගිණුම	25,566	-
		16,405,650	-
29.	**සේ.අ.අ./ව.සේ.අ.අ./ව.හා.අ.අ**		
	සේ.අ.අ./සේ.නි.හා.අ. නීති	395,480,359	502,339,066.59
	සේ.අ.අ./සේ.නි.හා.අ.	228,383,418	-
	සේ.අ. අරමුදල්	154,290,285	381,475,551.78
	වතු සේ.අ.අරමුදල්	20,978,325	19,139,467.04
	ල.වැ.අ.අරමුදල	2,895,240	3,200,017.96
		792,027,827	906,154,103
30.	සේ. නි.හා.අ. හා වෙනත් ගෙවිය යුතු		
	සේ.නි.හා.අරමුදල්	6,445,405	32,367,337
		6,445,405	32,367,337
31.	**තැන්පතු/දේපල බදු දීම නිසා ලැබූ අත්තිකාරම්**		
	බදු දේපල නිසා ලැබූ තැන්පතු	57,475,321	137,069,289
	වෙනත්	106,498,081	-
		163,973,403	137,069,289
32.	**බැංකු අයිරාව**		
	ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327554	49,422,534	65,540,328
	ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327553	4,943,149	9,049,107
	මහජන බැංකුව -යුනියන් පෙදෙස	2,457,104	2,279,589
	නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	954	954
		56,823,741	76,869,978

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණ ස්ථිතිය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය 1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1976 පෙබරවාරි 06 දිනැති අංක 199/1**M** දරණ ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානය අංක 55/75 වොක්ෂෝල් පටුමග, කොළඹ 02 හි පිහිටුවා ඇත.

1.2 මූලික කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

සලකන මූල්‍ය වර්ෂය තුල මණ්ඩලයේ මූලික කටයුතුවල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත. මණ්ඩලයේ මූලික කටයුතු වූයේ තේ හා රබර් වගා කිරීම, නිෂ්පාදනය සහ විකිණීමයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් තැරැව්කරුවන් හරහා තේ අලෙවි කිරීම වෙනුවට (අගය එකතු කල නිෂ්පාදන) ප්‍රාදේශීය තේ අලෙවිසැල් (ජන තේ/පාරිභෝගික සේවාව) පවත්වා ගෙන යයි.

2. සූදානම්වීමේ පදනම

2.1 ආකූලතා ප්‍රකාශය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ලාභ/අලාභ ප්‍රකාශය හා අනෙකුත් විස්තරාත්මක ආදායම්, මූල්‍ය තත්ව ප්‍රකාශය, මුදල් ගලා ඒමේ වෙනස්කම් දක්වන ප්‍රකාශය හා ගිණුම් රෙගුලාසි සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA of Sri Lanka) විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRS සහ LKAS) හා 1995 අංක 19 දරණ ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන සම්මත පනතට අනුව සකස් කර ඇත.

2.2 ඇගයුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික වියදම් ගිවිසුම් පදනම් කරගෙන සකස් කර ඇත. අදාල විශේෂ රෙගුලාසි අනුප්‍රාප්තීය සටහන් මගින් විස්තර කර ඇත. මූලය ප්‍රකාශනවල උද්ධමනිය සාධක සඳහා අනුකූලනය සිදුකර නොමැති අතර මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.

2.3 ඇස්තමේන්තු සහ විනිශ්චය භාවිතය

ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRSs/LKASs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රෙගුලාසි ආදේහනයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ වාර්තා කිරීමට බලපෑ හැකි තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකරණයක් අවශ්‍ය වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු කරන ලද අගයන්ට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒ සම්බන්ධ උපකල්පන පදනම් වී ඇත්තේ අතීත අත්දැකීම් සහ එම තත්වය යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන වෙනත් විවිද සාධක මත වන අතර අනෙකුත් ප්‍රභවයන් ගෙන් පහසුවෙන් වෙනස් කල නොහැකි වත්කම් හා වගකීම් වල වටිනාකම පිළිබඳ තීරණ ගැනීමේ පදනම වන්නේ එහි ප්‍රතිඵලයයි.

ඇස්තමේන්තු සහ උපකල්පන අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. සංශෝධන, එම මූල්‍ය වර්ෂයට පමණක් බලපෑම් ඇති කරයි නම් එම කාල පරිච්ඡේදයේදීද සංශෝධන එම මූල්‍ය වර්ෂයට සහ අනාගත මූල්‍ය වර්ෂය සඳහා බලපෑම් ඇති කරයි නම් සංශෝධන කාලපරිච්ඡේදය සහ අනාගත කාලපරිච්ඡේද වලදීද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.4 ඉදිරි ගමන

ආයතනයේ ඉදිරි ගමන සඳහා මණ්ඩලය පොදු, පෞද්ගලික සහ සේවක (PP & E) හවුල්කාරි සංකල්පයක් තුල නැවත ප්‍රතිව්‍යුහගත කිරීමට අධ්‍යක්ස මන්ඩලය තිරණය කර ඇත. භාවිත නොකල හෝ අවම වශයෙන් භාවිතා කල වත්කම් සහ දේපල පෞද්ගලික ආයෝජකයන් සමග කරන හවුල් ව්‍යාපාර සඳහා යෙදවීම අරමුණු කරගෙන වර්තමානයේදී ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ආරම්බ කර ඇත. නව ආයෝජන මගින් අපේක්ෂිත ආදායම් වලින් ජනනය වූ ආදායම් යොදාගෙන හිඟ EPF සහ ETF පියවීම සිදුකරයි. ඉදිරිගමන පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වනතුරු ඔවුන් කිසිදු ව්‍යාපාර කටයුත්තක් අතහැර දැමීම හෝ නතර කිරීම සිදු නොකරයි.

2.5 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පෙර වර්ෂයේ භාවිතා කල ප්‍රතිපත්ති සමග නිරන්තරයෙන් ක්‍රියාත්මක කර ඇත. වර්තමාන වසරේ දත්ත නිරූපනය කිරීම සඳහා අදාල ස්ථානවලදි මෙම සංඛ්‍යා සහ වාක්‍ය නැවත සකස්කිරීම සිදු කර ඇත.

2.6 වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්

මෙයට ඇතුලත් වන්නේ වාර්තාකරණ කාලයෙන් අවසන් වීමෙන් පසුව සිදුවන සිදුවීම් සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය අතර සිදුවන වාසිදායක හා අහිතකර සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම්වල ද්‍රව්‍යමයභාවය සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදි මූලය ප්‍රකාශනවල සුදුසු වෙනස්කම් හෝ අනාවරණ කිරීම් සිදු කරනු ලැබේ.

3 අනෙකුත් තොරතුරු

3.1 ජනවසම - ගලබොඩ වතුයාය

ඉහත වතුයාය 1999 වසරේ සි/ස ෆෑන් ඒෂියා බැංකුවට උගස් කර ඇති අතර එමගින් රු.මි.40 ක මූල්‍ය පහසුකමක් ලබාගෙන ඇත. ඉතිරියෙන් කොටසක් කලින්කලට පියවා ඇත. ගෙවිය යුතු පොලිය බැංකුවේ එකඟත්වය මත කපා හැර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 වන විට ශ්‍රේෂ පත්‍රයේ ශේෂය ලෙස රු.32,536,283 ක් පෙන්නුම් විය.

4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා ඇති සියළු කාල සඳහා පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශනය කර ඇත.

4.1 ණයට ගැනීමේ පිරිවැය

සාමාන්‍ය සහ විශේෂිත ණයටගැනීමේ පිරිවැය, අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම්විමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම් අත්පත් කරගැනිම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම ආරෝපණය වන අතර එම වත්කම් විකිණීම සඳහා සූදානම් වන තෙක් එම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

ණයගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය ආරම්භ වන්නේ එය වත්කම් සඳහා වියදම් දැරූ විට සහ වත්කම් අපේක්ෂිත භාවිතය හෝ විකිනීම සඳහා සූදානම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමේදි වේ. වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා අවශ්‍ය කටයුතු සැලකිය යුතු තරම් සිදුවූ විට ප්‍රාග්ධනීකරණය නතර කරනු ලැබේ. සුදුසුකම් ලබන වත්කමක ක්‍රියාකාරි සංවර්ධනය අත්හිටුවන්නේ නම් ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය අත්හිටවනු ලැබේ.

මණ්ඩලය විසින් අරමුදල් ලබාගෙන ඒවා නොමේරූ තේ, රබර් හා කටුපොල් වතුයායන් වැනි වත්කම් සඳහා යොදා ගනියි. ඉහත ජෛව වත්කම් සඳහා වන වියදම් සඳහා ප්‍රාග්ධනීකරණ අනුමැතියක් ආදේශ කිරීම මගින් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණයට ගැනීමේ පිරිවැය මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. මෙම අරමුණ සඳහා මණ්ඩලය සාමාන්‍ය ණය ගැනීම් සඳහා අදාල වන ණය ගැනීමේ පිරිවැයේ සාපේක්ෂ මධ්‍යනය භාවිතා කරයි. අනෙකුත් සියළු ණයට ගැනීමේ පිරිවැය ඒවා සිදුකල කාලයට අදාල ලාභ අලාභ ප්‍රකාශයෙන් හදුනාගනු ලබයි. නිශ්චිත ණය ගැනිම්වල තාවකාලික ආයෝජන මත උපයන ආයෝජන අදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන පිරිවැයෙන් සුදුසුකම් ලබන වත්කම් සඳහා ඔවුන්ගේ වියදම් කිරීම අඩු කල විට ලැබේ.

4.2 ඔවුන්ගේ තක්සේරුකරණයේ වත්කම් හා පදනම්

මූල්‍ය වත්කම් ප්‍රකාශයේ වත්මන් වත්කම් ලෙස වර්ගිකරණය කරන ලද වත්කම් වන්නේ මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ වාර්තාකරණ දින සිට වසරක් ඇතුලත මුදල් වලින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන දේ වේ. වත්මන් වත්කම් හැර අනෙකුත් වත්කම් වන්නේ වාර්තා කරන දිනයේ සිට වසරකට වැඩි කාලයක් රඳවා ගැනිමට මණ්ඩලය තිරණය කරන වත්කම් වේ.

වර්තමාන නොවන වත්කම් දිගු කාලයක් තිස්සේ නැවත තක්සේරු කර නොමැති අතර එම නිසා මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වල වටිනාකම ලෙස සඳහන් අගයට වඩා වර්තමාන වටිනාකම වෙනස් විය හැකිය.

4.2.1 දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හදුනාගැනිම හා ගණනය කිරීම, පිරිවැය තක්සේරු කිරීමේදි ලබන අගයෙන් සමුච්චිත ක්ෂය විම් අඩු කිරිම මගින් සිදුකරන බව වාර්තා වී ඇත. දේපල. යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නවල පිරිවැය යනු මිලදි ගැනීමට හෝ ඉදිකිරිමට දැරීමට සිදුවන වියදම සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් එහි සේවා තත්වයට ගෙනඒම සඳහා වන ඕනෑම වියදමක් වේ.

අදාල උපකරණවල ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වි ඇති මිළදී ගත් මෘදුකාංගය උපකරණයේම කොටසක් ලෙස ප්‍රාග්ධනිකරණය කර ඇත. දේපල, යන්ත්‍රෝපකරන සහ ආම්පන්න වල වෙන් වූ කොටස් (ප්‍රධාන සංරචක) ලෙස සලකනු ලබයි.

4.2.2 පසුකාලින වියදම්

දේපලක, යන්ත්‍රෝපකරණයක හෝ ආම්පන්නයක කොටසක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම මගින් මණ්ඩලය වෙත අනාගතයේදි ආර්ථික ප්‍රතිලාභ ගලා එයි නම් එය එහි වටිනාකම තුලින් හදුනාගෙන ඇති අතර එහි පිරිවැය විශ්වාසනියව මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි වටිනාකම දේපලෙහි, යන්ත්‍රෝපකරණවල සහ ආම්පන්නවල එදිනෙදා සේවා සැපයිම ලෙස ලාභ/අලාභ ප්‍රකාශනවල හදුනාගෙන ඇත.

4.2.3 ක්ෂයවීම/ක්‍රමක්ෂය

ක්ෂයවීම, දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නවල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලයට වඩා සෘජුවම ලාභය/අලාභය ලෙස හඳුනාගත හැකිය. වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි විට වන අතර වත්කම ක්ෂය කිරීම, ඒවා විකිණීම සඳහා වර්ගිකරණය කර ඇති (හෝ විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගිකරණය කර ඇති බැහැර කිරීමේ පුවරුවකට ඇතුලත් කර ඇති) දිනට පෙර නතර වේ. සින්නක්කර ඉඩම් සඳහා ක්සය කිරීම් අය නොකෙරේ.

වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල පහත දි ඇති වේගයෙන් ක්ෂය වීම සිදුවේ.

අයිතමය	වතුයායන්	ප්‍රධාන ශාඛාව
ගොඩනැගිලි	5%	5%
යන්ත්‍රෝපකරණ ආම්පන්න (පැරණි)	33.33%	12.5%
යන්ත්‍රෝපකරණ ආම්පන්න (නව)	20%	20%
නල පද්ධති හා වැසිකිලි	5%	5%
මෝටර් වාහන	25%	25%
ලී බඩු හා උපකරණ	12ග5%	12.5%
මේරූ වගාව	5%	5%
මාර්ග සහ පාලම්	5%	5%
ජල විදුලි බලාගාර	5%	5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර (නව)	20%	20%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	12.5%	12.5%

4.2.4 පරිගණක මෘදුකාංග

ආශ්‍රිත දෘඩාංග සමග අභ්‍යන්තරව සම්බන්ධ නොවන පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීයව මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා හේතුවන සියළුම පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍යය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

4.2.5 ස්ථීර ඉඩම් සංවර්ධන පිරිවැය

ස්ථීර ඉඩම් සංවර්ධන පිරිවැය යනු නව ප්‍රවේශ මාර්ග සහ අනෙකුත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉඩම් සමෝච්චයන්හි විශාල වෙනස්කම් සිදුකිරීමට දරණ ලද පිරිවැයයි. මණ්ඩලයේ ක්ෂයවීමේ ප්‍රතිපත්තියට අනුව මෙම වර්ගයේ ව්‍යාපෘති (මාර්ග, පාලම් ආදිය) සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීකරණය හා ක්ෂය කිරීම සිදුකරනු ලැබේ.

4.2.6 ආයෝජන දේපල (කුලියට ගත් ඉඩම් හා ගොඩනැගිලි)

ආයෝජන දේපල නිසි ලෙස රඳවා තබාගෙන ඇත්තේ කුලි ආදායම් උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන ඇගයීම සඳහා හෝ එම දෙකම සඳහා මිස සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා හෝ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයුම් හෝ පරිපාලනමය අරමුණු සඳහා නොවේ. ආයෝජන දේපල මනිනු ලබන්නේ මූලික පිළිගැනීම මත පිරිවැය අනුව වන අතර පසුව සිදුවන ඕනෑම වෙනසක් සාධාරණ වටිනාකමින් යුත් ලාභයක්/අලාභයක් ලෙස හඳුනාගත හැකිය.

ආයෝජන දේපල බැහැර කිරීමෙන් ලැබෙන ලාභයක්/අලාභයක් (ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම හා අයිතමවල වටිනාකම් අතර වෙනසිනි) ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගත හැකිය. පෙර දේපලක්, යන්ත්‍රෝපකරනයක් හෝ ආම්පන්නයක් ලෙස වර්ගිකරනය කර තිබූ ආයෝජන

දේපලක් විකුණූ විට නැවත තක්සේරු කිරීමේ සංචිතයට ඇතුලත් කර ඇති ඕනෑම මුදලක් රඳවාගත් ඉපයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2.7 සීමිත ජීවිත ඉඩම් සංවර්ධන වියදම්

නොමේරූ සහ මේරූ වගාවන්

නැවත සිටුවිම සහ අළුතින් සිටුවිම සඳහා සෘජුවම ආරෝපණය වන පිරිවැය අස්වැන්න නෙලන කාලය තෙක් නොමේරූ වගාවන් යටතේ වර්ගීකරණය කර ඇත. වෙළඳපල විසින් තීරණය කරන ලද මිල ගණන් හෝ අගයන් නොමැති නිසා සහ සාධාරණ වටිනාකම පිළිබඳ විකල්ප ඇස්තමේන්තු පැහැදිලිව විශ්වාස කල නොහැකි යයි තීරණය කර ඇති නිසා මන්ඩලය විසින් තේ. රබර්, කටු පොල් වැනි ජීව විද්‍යාත්මක වත්කම්වල නොමේරූ හා පරිනත වගාවන් එහි පිරිවැය යටතේ ගනනය කරනු ලබන අතර **LKAS** 16 යටතේ අර්ථදක්වා ඇති දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න යටතේ ඇති ජීව විද්‍යාත්මක වත්කම්වල ක්සය වීම් හා මූලික හඳුනාගැනීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය සපයා ඇති තීන්දුවලට අනුකූලව සිදු කරයි.

සාධාරණ වටිනාකම පහසුවෙන් තීරණය කල නොහැකි බැවින් තවාන් පිරිවැය යටතේ පවත්වා ගනු ලැබේ. පිරිවැය, සෘජු ද්‍රව්‍ය, සෘජු සේවකයින් හා සෘජුවම බලපාන හේතුවල සුදුසු අනුපාත වලින් සමන්විත වේ. එවැනි ජීව විද්‍යාත්මක වත්කමක සාධාරණ වටිනාකම විශ්වාසනීයව මැනිය හැකි වූ විට එම අගයෙන් විකිණීම සඳහා වැයවන මුදල අඩු කල විට ලැබෙන අගය මණ්ඩලය විසින් ගණනය කරයි.

ඉඩම් සැකසිම, වගා කිරිම හා භෝග මෝරන තුරු හෝ අස්වැන්න ලබාගන්නා තෙක් සංවර්ධනය කිරිම සඳහා දැරිය යුතු වන සියළු වියදම් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. බෝග මේරීමෙන් පසු දැරිමට සිදුවන සියළු වියදම් ලාභ/අලාභ ප්‍රකාශනයේ සෘජුවම හඳුනාගෙන ඇත. නැවත වගා කිරිම හා නව වගාවන් සඳහා අය කෙරෙන පොදු ගාස්තු වෙන් කරනු ලබන්නේ අදාල නැවත වගා කිරිම සහ නව වගාවන් සඳහා වැය කරන ලද ශ්‍රම දින ගණන පදනම් කරගෙන වන අතර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නොමේරූ ප්‍රදේශ පදනම් කරගෙනය. පොදු වියදම්වල ඉතිරි කොටස ගණනයන් සිදුකරනු ලබන කාල සිමාවට අදාල වියදම් වේ.

	නොමේරූ අවධිය	අස්වනු නෙලීම ආරම්භය
තේ	වසර 1 – 4	5 වන වසර
රබර්	වසර 1 – 6	7 වන වසර

4.2.8 බිම් පිරවීම සඳහා වියදම්

පෙරදී සිදුකරන ලද බිම් පිරවුම් කාරය සාධක ඇගයීමට වඩා අපේක්ෂිත අනාගත වාසිදායක තත්වයන් වැඩි, මේරූ ක්ෂේත්‍ර සඳහා බිම් පිරවුම් ලෙස භූමිය සංවර්ධනය වැය වන මුදල් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අදාල මේරූ වතුයායේ ප්‍රයෝජනවත් ආර්ථිකයක් ඉතිරිව පවතින නව වත්කම් හෝ අපේක්ෂිත බදු කාලය අඩු නම් පිරවුම් වියදම් ක්ෂය වේ.

පිරවුන් වියදම් ප්‍රාග්ධනීකරණය කර නොමැති නම් ඒවා සිදු කල වසරේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

දැව වගාව

මූලික හදුනාගැනිමේදි දැව වගාව සාධාරණ අගයකින් ගණනය කර ඇති අතර සහ සැම වාර්තාකරණ කාල සිමාවක් අවසානයේදිම විකිණීම සඳහා වන වියදම් එනම් ප්‍රවාහනය ඇතුළු විකිණීමට අවශ්‍ය වන වියදම් සියල්ල අන්තර්ගත මුළු වියදම එම සාධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

සාධාරණ වටිනාකමක් ඇති දැව වගාවන් විකිණීම සඳහා අඩු පිරිවැයක් දැරීම සහ සාධාරණ වටිනාකම් වෙනස්වීමෙන් එක් එක් වාර්තාකරණ දිනයේදි වැවිලි සඳහා අඩුවන පිරිවැය ඒවා පැන නගින කාල සීමාව සඳහා ලාභාලාභ ප්‍රකාශයට ඇතුලත් වේ. වත්කම් පවත්වාගෙනයාම සඳහා දැරීමට සිදුවන සියළු වියදම් එම අදාල වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශයට ඇතුලත් වේ.

ජීව විද්‍යාත්මක වත්කම්

මණ්ඩලය විසින් වත්කම අතීත කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස පාලනය කරයි නම් ජීව විද්‍යාත්මක වත්කම් පිළිගැනිම සඳහා සුදුසුකම් ලබයි. වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ලාභයන් මණ්ඩලය වෙත ගලා එන අතර සාධාරණ අගය හෝ වත්කමේ වියදම නිරවද්‍ය ලෙස ගණනය කල හැකි වේ.

4.2.9 භාණ්ඩ ලේඛනය

යල් පැනගිය සහ අඩුවෙන් විකිණෙන භාණ්ඩ සඳහා නිසි දීමනා ලබාදීමෙන් පසු නිෂ්පාදන තොග සහ තවාන් හැර අනෙකුත් භාණ්ඩ වියදම් අඩු සහ ශුද්ධ අගයන් ඇති භාණ්ඩ ලෙස සඳහන් වේ. භාණ්ඩ ලේඛන සඳහා වියදම් නියම කිරීමේදි මණ්ඩලය විසින් **FIFO** ක්‍රමවේදය යොදා ගනියි. මෙම වියදම් සඳහා කොටස් ලබාගැනිම**,** නිෂ්පාදනය සහ පරිවර්තන වියදම් සහ පවතින ස්ථානයට සහ තත්වයට ළඟා කරගැනිමට දැරිය යුතු වූ වියදම් ආදිය අන්තර්ගත වේ. ශුද්ධ වටිනාකම ලෙස අදහස් වන්නේ තක්සේරුකරන ලද වටිනාකමෙන් භාණ්ඩය සම්පූර්ණ කිරිමට තක්සේරු කරන ලද වියදම හා භාණ්ඩය විකිණීම සඳහා දැරීමට සිදුවන වියදම් ලෙස තක්සේරු කරන ලද වියදම් අඩුකල විට ලැබෙන අගයයි.

ශ්‍රේෂ පත්‍රයේ සඳහන් දිනය තෙක් නිපදවන ලද භාණ්ඩවල වටිනාකම අධිගත් අගය අනුව ගණනය කරන ලදී. ඉතිරි තොගයේ වටිනාකම තක්සේරුගත විකුණුම් මිල අනුව ගණනය කරන ලදී. මෙම අගයෙන් ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා වියදම් වන සියළු මුදල් අඩු කල විට ලැබෙන ශුද්ද අගය වේ.

තේ කිලෝ ග්‍රෑම් 1ක නිෂ්පාදන පිරිවැය සෑමවිටම ගණනය කල ශුද්ධ අගයට වඩා ඉහළ වේ.

<u>මූල්‍යමය වත්කම්</u>

LKAS 39 විෂය පථය තුල ඇති මූලික හදුනාගැනිම සහ මූල්‍ය වත්කම් මැනිම ලාභ හෝ අලාභ**,** ණය හා ලැබිය යුතු මුදල්**,** කල් පිරිම සඳහා තබා ඇති ආයෝජන. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් හෝ කොටුකිරිමේ උපකරණ ලෙස නිමිති කල දේ මූල්‍ය වමත්කම් ලෙස වර්ගිකරණය කර ඇත. මූල්‍ය වත්කම් මූලික හදුනාගැනිමේදි මණ්ඩලය විසින් එහි වර්ගීකරණය සිදුකරනු ලැබේ.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

සියළු මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර ලාභය හෝ අලාභය ලෙස සාධාරණ වටිනාකමක් නොමැති වත්කම් සඳහා ගණුදෙනු පිරිවැය යොදා ගනියි. වෙළඳපලේ (සාමාන්‍ය වෙළඳාම්) රෙගුලාසි හෝ ගිවිසුම් අනුව ස්ථාපිත කරන ලද කාල රාමුවක් තුල බෙදා හැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් හඳුනාගැනීම, මිලදී ගැනීම හෝ විකිණීම වෙළඳාම් කරන ලද දිනයේදී එනම් මණ්ඩලය විසින් වත්කම මිළදී ගැනීම හෝ විකිණීම සිදුකිරීමට පවරන දිනයේදී සිදුකල යුතුය. මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හෝ මුදල් වලට සමාන දේ, කෙටිකාලීන තැන්පතු, ණය සහ සැපයුම්කරුවන්ට දෙන ලද අත්තිකාරම්, විකුණුම් සහ අනෙකුත් ලැබිය යුතු ආදායම් අයත් වේ.

<u>පසුව සිදුකරන ගණනය කිරීම</u>

මූල්‍ය වත්කම්වල පසුව සිදුකරන ලද ගණනය කිරීම් පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කරනු ලැබේ. ලාභය හා අලාභය තුලින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ මිළදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළඳාම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කර ඇත. **LKAS 39** මගින් අර්ථ දක්වා ඇති පරිදි ඉදිරියේදී ආරක්ෂා විමේදි ඇතිවන සම්බන්ධතාවල ආරක්ෂිත උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කර ඇති ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මෙම කාණ්ඩයට ඇතුලත් වේ. වෙන්කල, කාවැද්දූ ව්‍යුත්පන්නයන් ඇතුළු ව්‍යුත්පන්නයන් ඵලදායී ඉදිරි ආරක්ෂක උපකරණ ලෙස නම් නොකලහොත් වෙළඳාම සඳහා රඳවා ඇති ඒවා ලෙස වර්ගීකරනය කර ඇත. සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදුවූ වෙනස්කම් දක්වා ඇත. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදි විකිණීම සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභ හා අලාභය මගින් ඇගයීමක් කරන ලදී. අක්‍රීය වෙළඳපලවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදි විකිණීමට කළමනාකාරිත්වය අරමුණු කරගෙන ඇත.

සැලකිය යුතු ලෙස වෙනස් වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරාගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීම හෝ කල් පිරෙන තෙක් තබාගැනීම වත්කම්වල ස්වභාවය මත රදා පවතියි.

<u>ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්</u>

විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයක් සහිත ලෙස මූලිකව හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්වලට අන්තර්ගත වේ. විකිණීමේදි හෝ නුදුරු කාලයේදි නැවත මිලදි ගැනීමේ අරමුණකින් තබා ගත් මූල්‍ය වත්කම්, විකිණීම සඳහා තබා ඇති දේ ලෙස වර්ගීකරණය කර ඇත. **LKAS 39** හි අර්ථ දක්වා ඇති පරිදි මෙම කාණ්ඩයට ඉදිරි රැකුම් සම්බන්ධතාවල රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුලත් වේ. වෙනම පවතින ව්‍යුත්පන්න ඇතුළු ව්‍යුත්පන්න ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති නම් විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කර ඇත. සාධාරණ අගයන් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදායම් ප්‍රකාශයේ මූලය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදු වූ වෙනසක් දක්වා ඇත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීම සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභය හෝ අලාභය මගින් ඇගයීමක් කරන ලදි. අක්‍රිය වෙළඳපලවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදී විකිණීමට මණ්ඩලය අරමුණු කරගෙන ඇත.

සැලකිය යුතු වෙනස්වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරාගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීම හෝ කල් පිරෙන තෙක් තබාගැනීම වත්කම්වල ස්වභාවය මත රඳා පවතී.

ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ක්‍රියාකාරී වෙළඳපලක සඳහන් නොවන ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් අඩු අපහායනය සහිත කාර්යක්ෂම පොලී අනුපාත ක්‍රමයක් යටතේ **(EIR)** ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනිම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ **EIR** හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. **EIR** ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ අන්තර්ගත කර ඇත.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම් යනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා විකිණීම සඳහා ලබාදී ඇති පරිදි නම් කර ඇති අතර ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණයෙන් වර්ගීකරණය කර නොමැත.

විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් සහ ඍජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැයකින් හදුනා ගැනේ. මූලික හදුනාගැනිමකින් අනතුරුව ඒවා මනිනු ලබන්නේ හානිකර පාඩු සහ පවතින ණය උපකරණවල විදේහ මුදල් වෙනස හැරුණු විට සාධාරණ වටිනාකම් සහ ගාස්තු අනුව වන අතර වෙනත් පුළුල් ආදායමකින් හදුනාගෙන සාධාරණ කොටස් සංචිතයේ සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. ආයෝජනයක් හදුනා නොගත් විට කොටස්වල එකතු වී ඇති ලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කෙරේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්, කොටස් සුරැකුම්පත් වලින් සමන්විත වේ.

පිළි නොගැනීම

මූල්‍ය වත්කමක් (හෝ අදාල ස්ථානවලදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සහිත මණ්ඩලයකින් කොටසක්) පිළිනොගැනීම සිදුවන්නේ එම වත්කමින් මුදල් ඉපයීමේ අයිතිය කල් ඉකුත් වූ විටය. වත්කම මගින් ලැබෙන මුදල් ලබාගැනීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා දී ඇත. නැතහොත් කිසියම් විධිවිධානයක් හරහා තෙවන පාර්ශවයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් සම්පූර්ණ ගෙවීමට බැදී සිටියි. මණ්ඩලය විසින් **(a)** වත්කකම්වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති හෝ **(b)** වත්කම්වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ මාරු කිරීම හෝ රඳවා තබාගැනීම සිදුකර නොමැති නමුත් වත්කම් පාලනය කිරීම පවරා ඇත.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා මණ්ඩලය සිය අයිතිවාසිකම් මාරු කර ඇති විට හෝ විධිවිධානයක් හරහා ගමන් කර ඇති විට සහ වත්කම්වල සියළු අවධානම් සහ විපාක සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

නොමැති විට සහ එහි පාලනය මාරු කර නොමැති විට මණ්ඩලය විසින් එයට අඛණ්ඩව සම්බන්ධ වන තරමට එම වත්කම් හඳුනාගැනීම සිදුවේ.

එවැනි අවස්ථාවක මණ්ඩලය විසින් හවුල් වගකීමක් හඳුනා ගනියි. පැවරූ වත්කම හා හවුල් වගකීම ගණනය කිරීම මණ්ඩලය රඳවාගත් අයිතිවාසිකම් හා බන්ධනය මගින් පිළිඹිබු වේ.

මූල්‍ය වත්කම් අපහායනය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් අපහායනය වූවාදැයි පරීක්ෂා කිරීමට මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීමක් සිදු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් දුර්වල යැයි සලකනු ලබන්නේ වත්කම මුලින් හඳුනාගැනිමෙන් පසුව සිදුවන සිදුවීම් එකක් හෝ වැඩි ගනනක ප්‍රතිඵානියන් ලෙස හානියක් සිදුවූ බවට වෛෂයික සාක්ෂි තිබේ නම් සහ එම මූල්‍ය වත්කමට හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයේ අනාගත මුදල් ලැබීම්වලට තක්සේරු කල හැකි බලපෑමක් සිදුවන්නේ නම් පමණි.

හානිය පිළිබඳ සාක්ෂිවලට සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්දකින ණයගැතියන් හෝ ණය මණ්ඩලයක් ඇති බවට සාක්ෂි, පොලී හෝ මූලික ගෙවීම පැහැර හැරීම හෝ අඩුපාඩුකම්, ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට සහ අනාගත මුදල් ලැබීම් මැනිය හැකි ලෙස අඩුවිය හැක. එනම් හිඟ මුදල්වල වෙනස්කම් හෝ සම්බන්ද වන ආර්ථික තත්වයන් අන්තර්ගත විය හැකිය.

මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම සහ මිනුම්

LKAS 39 වපසරිය තුල පවතින මූල්‍ය වගකීම් යෝග්‍ය ලෙස ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයන් සහිත මූල්‍ය වගකිම්, ණය හා ණයට ගැනීම්, ඵලදායී රකුමක රැකුම් උපකරණයක් ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කල හැකිය. මූලික හඳුනාගැනිමේදි මණ්ඩලය විසින් අදාල මූලික වගකිමේ වර්ගිකරණය හඳුනාගනියි.

සියළු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයකින් හඳුනාගන්නා අතර ණය හෝ ණයට ගැනීම් සැලකිමේදි ක්‍රමක්ෂය පිරිවැය සලකයි. මේ සඳහා සෘජුවම ආරෝපණය කල හැකි ගණුදෙනු පිරිවැය අන්තර්ගත වේ. මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළදාම් හා අනෙකුත් ගෙවිය යුතු දේ, බැංකු අයිරා සහ ණයට ගැනීම් අන්තර්ගත වේ.

පසුව සිදුකරන ගණුනය කිරීම්

මූල්‍ය වත්කම මැනිම ඔවුන්ගේ පහත වර්ගිකරණය මත තීරණය වේ.

ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම්

ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම්වලට වෙළඳ කටයුතු සඳහා පවතින මූල්‍ය වගකීම් හා ලාභ/අලාභ ලෙස සාධාරණ අගයකින් මූලික හඳුනාගැනීමේදිම හඳුනාගත් මූල්‍ය වගකිම් ඇතුලත් වේ.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

මූල්‍ය වගකීම් වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඒවා නුදුරු අනාගතයේදි විකිණීමේ අරමුණ ඇතිව ලබාගත්තේ නම්ය. **LKAS** 39 ට අනුව රැකුම් සබඳතාවල රැකුම් උපකරණ ලෙස හඳුනාගෙන නොමැති මණ්ඩලය මගින් ඇතුළු වූ ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් මෙයට ඇතුලත් වේ. වෙන්කල කාවැද්දූ ව්‍යුත්පන්න ඵලදායී රැකුම් උපකරණ ලෙස හඳුනාගෙන නොමැති නම් ඒවාද වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගිකරණය කරයි. වෙලඳ කටයුතු සඳහා ගෙන ඇති වගකීම්වල ලැබීම් හා වියදම්වීම් ලාභ හා අලාභ තුලින් හඳුනා ගනියි. මූලික හඳුනාගැනිම තුල ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම් මණ්ඩලය විසින් හඳුනාගෙන නොමැත.

ණය සහ ණයට ගැනීම්

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ඵලදායී පොලි අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මත පොලි දරණ නය සහ ණයට ගැනිම් පසුව මැනිම සිදුකරයි. වගකිම් හඳුනා නොගත් විට ආදායම් ප්‍රකාශයෙන්ද ක්‍රමක්ෂය ක්‍රියාවලියේ ඵලදායී පොලී අනුපාත ක්‍රමයෙන්ද **(EIR)** ලැබීම් හා වියදම් හඳුනාගනියි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීම සහ ගාස්තු හෝ පිරිවැය පිළිබද කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගෙන වන අතර එය ඵලදායී පොලි අනුපාත ක්‍රමයේ අනිවාර්ය අංගයකි. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් වල අන්තර්ගත කර ඇත.

හඳුනා නොගැනීම

වගකිම යටතේ ඇති බැදිම නිදහස් කල විට**,** අවලංගු කලවිට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකිමක් හඳුනා නොගැනිම සිදුවේ. පවත්නා මූල්‍ය වගකිමක් එකම ණය දෙන්නා ගෙන් වෙනත් අයෙකු විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්තාපනය කල විට හෝ පවත්නා වගකිම් පිලිබද කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කල විට එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරිමක් සලකනු ලැබේ.

මුල් වගකීම හඳුනා නොගැනිම සහ නව වගකීමක් හඳුනාගැනිම සහ අදාල රැගෙන යන ප්‍රමානයන්හි වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

මූල්‍ය උපකරණ හිලවු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූලය තත්ව ප්‍රකාහයේ වාර්තා කර ඇති ශුද්ද මුදල හිලවු වන්නේ පිලිගත් මුදල් පියවා ගැනීමට**,** ශුද්ධ පදනම් මත පියවිමට හෝ වත්කම් සාක්ෂාත් කරගැනීමට හෝ වත්කම් එකවර පියවිමට වර්තමාන බලාත්මක කල හැකි නිතිමය අයිතියක් තිබේ නම් පමණි. මණ්ඩලයේ ගිණුම් පිළිවෙත්වල විශේෂයෙන් සදහන් කර ඇති පරිදි කිසියම් ගිණුම් සම්මතයක් හෝ අර්ථ නිරූපනයක් සදහා අවශ්‍ය වන හෝ අනුමැතිය ලබාදි හෝ නොමැති නම් ආදායම් ප්‍රකාශය තුල ආදායම් හා වියදම් හිලවි නොකරනු ඇත.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සෑම වාර්තා කරන දිනයකදීම ක්‍රියාකාරී වෙළඳපල තුල වෙළඳාම් කල මූල්‍ය උපකරණවල සාධාරණ අගය**,** ගණුදෙනුව සඳහා වන කිසිදු වියදමක් අඩු නොකර උපුටා ගත් වෙළඳපල මිල හෝ බෙදා හරින්නාගේ මිල ගණන් (දිගු කාලිනව ලන්සු තබා කෙටි කාලින මිල විමසීම) අනුව හඳුනා ගනියි. ක්‍රියාකාරී වෙළඳපල තුල වෙළඳාම් සිදු නොවන මූල්‍ය උපකරණවල සාධාරණ මිල යෝග්‍ය තක්සේරු ක්‍රමවේද අනුව හඳුනා ගනියි.

එවැනි ක්‍රමවේද සඳහා මෑත කාලයේ වෙළඳපල ගණුදෙනු ලබාගැනීම, මෙයට සමාන වෙනත් මූල්‍ය උපකරණයක සාදාරණ අගය ගැනීම, වට්ටම් සහිත මුදල් ගැලුම් සමාලෝචනය හෝ අනෙකුත් තක්සේරු කරන ක්‍රමවේද ආදිය අන්තර්ගත වේ.

<u>ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම්, අවිනිශ්චිත වත්කම්</u>

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට, වර්තමාන වගකිමක් (නෛතික හෝ ඉදිකිරිම්) ඇතිවිට සහ සම්පත් පිටතට ගලායාම මගින් ආර්ථික වාසි ඇතිවන බවට අනුමාන කල හැකිවිට වගකිම් පියවිය යුතු අතර වගකිම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කල හැකිය.

සම්පත් පිටතට ගලායාම විදුර නොවේ නම් සියව අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස අනාවරණය වේ. ආර්ථික ලාභ ලැබීමක් සිදුවිය හැකි නම් අවිනිශ්චිත වත්කම් අනාවරණය වේ.

4.2.10 වෙළදාම් සහ අනෙකුත් ලැබීම්

ළඟා කරගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන් සහ අයහපත් සහ සැක සහිත ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන අගයන් අනුව වෙළදාමෙන් ලැබිය යුතු දේ සඳහන් කර ඇත.

4.2.11 මුදල් හෝ මුදල් වලට සමාන දේ

මුදල් හෝ මුදල්වලට සමාන දෑ මුදල් ශේෂයන්. ස්ථිර තැන්පතු සහ ඇරයුම් තැන්පතු වලින් සමන්විත වේ. ඉල්ලුම අනුව නැවත ගෙවිය යුතු සහ මණ්ඩලයේ මූල්‍ය කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහයන්වල අරමුණක් ලෙස මුදල් හෝ මුදල්වලට සමාන දේ වලට අන්තර්ගත කර ඇත.

වක්‍රාකාර ක්‍රමයක් මත පදනම්ව සකස් කරන ලද මුදල් ගැලීමේ ප්‍රකාශයේ නිරූපණය කිරිම සඳහා ගෙවන ලද පොලිය මෙහෙයුම් මුදල් ගැලිමක් ලෙසත් ලැබුණු පොලිය ආයෝජන මුදල් ගැලිමක් ලෙසත් වර්ගීකරණය කර ඇත.

5 වගකීම් සහ ප්‍රතිපාදන

5.1 සේවකයින්ගේ විශ්‍රාමික වරප්‍රසාද

(a) පවතින වරප්‍රසාද සැලසුම්
සුදුසුකම් සපුරා ඇති සේවකයින්ට 1983 අංක 13 දරණ පාරිතෝෂික ගෙවිම් පනත සහ 1978 අංක 34 දරණ ඉන්දියානු දේශප්‍රත්‍යාවර්තක පනතට අනුව විශ්‍රාමික වරප්‍රසාද සැලැස්මක් සකස් කර ඇත. විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය මත **LKAS** 19 ට අනුකූලව සියළුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදී නොමැත. කෙසේවෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව සේවකයින් සඳහා ගෙවිමේ වගකිම අඛණ්ඩ පස් අවුරුදු සේවා කාලයකට පසුව මතුවේ. මූල්‍ය ප්‍රකාහනවලට ඇති සටහන්වල වගකිම් අන්තර්ගත කර ඇත.

(b) පැරණි සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික

2017 දෙසැම්බර් 31 දිනට වතුයායේ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික දිමනා නිවැරදිව ගණනය කර වතුයායේ ගිණුම්වල ඇතුලත් කර ඇත. පැරණි සේවකයින් සඳහා ගෙවිය යුතු මුදල් 2017 දෙසැම්බර් වන විට රු.560,610,171.08 ක් වේ.

(c) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

විශ්‍රාමික පාරිතෝෂික සඳහා සියළු සේවකයින්ගේ සේවයේ පළමු වසරේ සිට ප්‍රතිපාදන වෙන් කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත. පාරිතෝෂික වලට අදාලව ශේෂ පත්‍රයේ හඳුනා ගත් වගකීම් යනු වාර්තා කරන කාල සීමාව අවසන් වූ විට බැදීමේ වර්තමාන වටිනාකම වේ. මණ්ලඩය විසින් සෑහෙන කාලයකින් ආයු ගනන තක්සේරුවක් සිදු කර නොමැත.

(d) නිශ්චිත දායකත්ව සැලසුම් (EPF, ETF, ESPS, CPPS)

නිශ්චිත අර්ථසාධක අරමුදලට සහ සේවක විශ්වාසී අරමුදලට සුදුසුකම් ලබා ඇති සියළු සේවකයින් අදාල ප්‍රතිපත්ති සහ රෙගුලාසිවලට අනුකූලව අදාල දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සේවකයින්ගේ දල වැටුප් අනුව 12% ක් EPF, ETF, ESPS, CPPS අරමුදල් සඳහාද 3% ක් **ETF** අරමුදල සඳහාද මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

2001 සිට 2017 තෙක් නියම කරන ලද කාලය තුල EPF, ETF **සහ** ESPS, CPPS, EPF, **ETF** මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොමැත. කම්කරු කොමසාරිස් විසින් අදයක්ස මන්ඩලයට එරෙහිව නිතිමය පියවර ගෙන ඇත.

2017.12.31 වන දිනට ශේෂයන්

ගෙවිය යුතු **EPF** (2000 – 2017)	රු.339,700,736.86
ගෙවිය යුතු **ETF** (2000 – 2017)	රු. 25,724,364.15
ගෙවිය යුතු **ESPS** (2000 – 2017)	රු. 32,487,286.97
ගෙවිය යුතු **CPPS** (2000 – 2017)	රු. 5,080,487.62
EPF/ETF ගැටළු (2000 – 2017)	රු.395,480,358.92

5.3 රාජ්‍ය ප්‍රදානයන්

දේපලක්, යන්ත්‍රෝපකරණයක් හා ආම්පන්නයක් මිලදී ගැනීමට අදාල රාජ්‍ය ප්‍රදානයන් ගණනය කරනු ලබන්නේ පිරිවැයෙන් අපහායන හානිය අඩු කිරීමෙන් වන අතර ඒවා ලැබේ යැයි සාධාරණ සහතිකයක් පවතින විට ඒවා මූලිකව හඳුනාගත් සාධාරණ අගයකින් යුක්ත විලම්බිත ආදායමක් ලෙස පිළිගැනේ. තවද මණ්ඩලය ප්‍රදාහය හා සම්බන්ද කොන්දේසි වලට අවනත වනු ඇති අතර අදාල වත්කම්වල අපේක්ෂිත ජීවිතවලට වඩා සරල රේඛීය පදනම මත ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ.

මණ්ඩල වියදම් හෝ දැනටමත් සිදුවී ඇති පාඩු සඳහා වන්දි ලබාදෙන ප්‍රදාන, ලැබිය යුතු කාල සීමාව සහ වියදම් හඳුනාගත් විට වෙනත් ආදායමක් ලෙස ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශය මගින් හඳුනා ගැනේ. සලකන වර්ෂය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් රු.679,300,000.00 ක මුදලක් ලැබුණි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2017

වෙළඳ ගෙවීම්

වෙළඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සැපයුම්කරුවන් ගෙන් ලබාගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට බැදී සිටීමයි. ගෙවීම් වසරක් හෝ ඊට අඩු කාලයක් තුල ගෙවිය යුතු නම් ගෙවිය යුතු ගිණුම් වර්තමාන වගකීම් ලෙස වර්ගිකරණය කර ඇත. එසේ නොමැති නම් ඒවා වර්තමාන නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත. වෙළඳ ගෙවීම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ.

බදුකරණය

වත්මන් බද්ද

බදු වියම් වත්මන් බදු වියදම් හා විලම්භිත බදු වලින් සමන්විත වේ. වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන් සඳහා පවත්නා ආදායම් බදු වත්කම් හා වගකීම් මනිනු ලබන්නේ බදු අයකර ගැනීමේ බලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය අනුවය. මුදල් ගණනය කිරීම් සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති යනු ශේස පත්‍රයේ දිනය අනුව බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවාය. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයක් මත වන අතර 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන හා ඒ සඳහා වන සංශෝධන අනුව ගණනය කෙරේ.

5.3 ආදායම් ප්‍රකාශය

ආදායම්

මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇතිතාක් දුරට ආදායම හඳුනා ගෙන ඇති අතර ගෙවීම සිදුකරන්නේ කුමන අවධියක වුවත් ආදායම පහසුවෙන් මැනිය හැකිය. භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබෙන දේවල සාධාරණ වටිනාකම්, ශුද්ධ ප්‍රතිලාභ හා දීමනා, වෙළඳ වට්ටම් හා පරිමා වට්ටම් මතය. සැලකිය යුතු අවධානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත මාරු කර ඇත්නම් සලකා බලන ලද අගය යථාර්ථයක් කර ගැනීමට හැකියාවක් පවතියි නම් ඒ හා සම්බන්ද පිරිවැය හා භාණ්ඩවල ප්‍රතිලාභ විශ්වාසදායක ලෙස තක්සේරු කල හැකි නම්, භාණ්ඩ සමග අබණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති නම් හා ආදායම් ප්‍රමාණය විශ්වාසව මැනිය හැකිනම් ආදායම හඳුනගත හැකිය.

වාර්තා කරන දිනයේදි ගණුදෙනුව අවසන් කිරීමේ අදියරට සමානුපාතිකව ඉටුකරන ලද සේවාවන් ලෙන් ලැබෙන අදායම ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. සිදුකරන ලද කාර්යයන් පිළිබද සමීක්ෂණය මගින් සම්පූර්ණ කිරීමේ අදියර තක්සේරු කරනු ලැබේ. අරමුණුවල නිමිකාරිත්වයේ සැලකිය යුතු අවධානම් සහ ප්‍රතිලාභ ආයතන විසින් මාරු කරන වෙලාව තීරණය කිරීම සඳහා මණ්ඩලය පහත සඳහන් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

(a) වෙන්දේසියේදි තේ විකිණීම

ලංකා තේ වෙළඳුන්ගේ සංගමය (17 වන කොටස) විසින් නිකුත් කරන ලද තේවල නිති හා කොන්දේසි වලට අනුව වැඩිම ලන්සුකරු පිළිගනු ලබන අතර මිටිය පහලට වැටෙන අවස්ථාවේදි විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකඟ වූ මිල හා ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහලට එසවීමෙන් වේ.

(b) වෙන්දේසියේදී රබර් විකිණීම

කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද රබර් වල නිති හා රෙගුලාසිවලට අනුව ලංසුකරු පිළිගනු ලබන අතර මිටිය පහලට වැටෙන අවස්ථාවේදී විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකඟ වූ මිල සහ ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහලට එසවීමෙන් වේ.

(c) දැව වගාව අස්වනු නෙලීම

නෛතික හිමිකාරිත්වය සහ ගැනුම්කරුට අලාභ මාරුවීමේ අවධානම සහ විකුණන ප්‍රමාණය තීරණය කල විට දැව විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ.

(d) දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හා අලාභ

ලාභය හෝ අලාභය තීරණය වන්නේ ශුද්ධ විකුණුම් ආදායම රැගෙන දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සමග සංසන්ධනය කිරීමෙන් වන අතර එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිකරණය කරනු ලබන වෙනත් සුදුසුකම් සහිත වත්කම් තුල ශුද්ධ ලෙස හඳුනා ගැනේ.

(e) බදු ආදායම්

මණ්ඩලය විසින් ඉඩම් හා කර්මාන්තශාලා විවිධ පාර්ශවයන්ට බදු දී ඇති අතර ඔවුන් ගෙන් ලැබනෙ ආදායම බදු ආදායම ලෙස හඳුනාගෙන ඇත. ඒවා ලැබීම් මත මාසිකව සහ වාර්ෂිකව ගණනය කරයි.

(f) රාජ්‍ය දීමනා

ප්‍රදානයන් මුලින් හඳුනාගනු ලබන්නේ ඒවා ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ මණ්ඩලය ප්‍රදානය හා සම්බන්ද කොන්දේසි වලට අනුකූල වන විටය. වියදම් සඳහා මණ්ඩලය විසින් වන්දි ලබාදෙන ප්‍රදාන, පිරිවැය හඳුනාගත් කාල පරිච්ඡේදයන් තුල ක්‍රමානුකූල පදනමක් මත ලාභ හා අලාභ ප්‍රකාශය මගින් හඳුනා ගැනේ.

5.3.2 වියදම් හඳුනාගැනිම

ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා දරනු ලබන සියළු වියදම් වර්ෂය සඳහා ලබාගැනීමේදි ආදායමට අය කෙරේ. අළුත්වැඩියා කිරීමේ හා අළුත්කිරීමේ වියදම් සිදුවූ වර්ෂයේ ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙන් අය කිරිම සිදු වේ.

මූල්‍ය පිරිවැය

ණය ගැනීමෙන් ඇති වූ පොලි වියදම, ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයකින් සමන්විත මූල්‍ය වත්කම්වල සාධාරණ අගයෙන් අය කරන ගාස්තුව හා ලාභ හෝ අලාභ ප්‍රකාශය මගින් හඳුනාගත් රැකුම් අපකරණ මගින් සිදුවන අලාභයන් මූල්‍ය පිරිවැයට අන්තර්ගත වේ. සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කරගැනිම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය නොවන ණය ගැනීමේ පිරිවැය ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හා අලාභ ප්‍රකාශයෙන් හඳුනාගැනේ. වගකිම්වල ඉතිරි ශේෂය මත නියත වරින්වර පොලී අනුපාතයක් බිහි කිරීම සඳහා මූල්‍ය කල්බදු ගෙවීම්වල පොලී වියදම් සංරචකය බදු කාල සීමාව තුල එක් එක් කාල පරිච්ඡේදයට වෙන්කරනු ලැබේ.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ලැබෙන පොලිය මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇති අතර ගෙවනු ලබන පොලිය වක්‍ර ක්‍රමය භාවිතයෙන් සකස් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } පිවිල්ඒ/ඒ/පේර්ඩිබී/01/2017/19

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 පෙබරවාරි 02 දින

සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යළෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

J. E. D. B
08 FEB 2022
RECEIVED
CHAIRMAN'S OFFICE

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් -
1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

මගේ අංකය எனது இல. My No. } පිළිල්/ඒ/ජේවීඩබ්/01/2017/19 | ඔබගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 පෙබරවාරි 01 දින

සභාපති,

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2018 ඔක්තෝබර් 17 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම;

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොළුවෝව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொலுவாவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.3 විගණනයේ විෂය පථය

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය,ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තා ගත වූ හෝ වාර්තා නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.39,955,487 හා රු.1,549,043,313 ක ඍණ අගයක් ගෙන තිබුණි. මෙවැනි තත්වයක් මත තව දුරටත් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව මණ්ඩලය පවත්වා ගෙන යෑමේ අවිනිශ්චිත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ඉහත ප්‍රමිතියේ ඡේද අංක 66(ඇ) අනුව "වත්කම වාර්තාකරන කාලපරිච්ඡේදයෙන් පසුව අවම වශයෙන් මාස දොළහක් පසුවනතුරු වගකීමක් නිරවුල් කිරීම හෝ හුවමාරු කිරීම, සීමාකර නැත්නම් මුදල් හෝ මුදල් සමාන දෑ LKAS 7 හි අර්ථ නිරූපණය කර ඇති ආකාරය වනවිට අස්තිත්වයක් අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කළ යුතුය. ඒ අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 2012 පැය්තැම්බර් 21 දිනැතිව රු.2,500,000 ක ස්ථාවර තැන්පතු වල කරන ලද ආයෝජනය, 2017 දෙසැම්බර් 31 දින වන විට රු. 3,803,642 ක් දක්වා වර්ධනය වී තිබුණද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හා අංක 07 අනුව එම තැන්පතුවේ වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත විය යුතු වුවත්, එය මණ්ඩලය විසින් ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02

ප්‍රමිතියේ ඡේද අංක 31 ප්‍රකාරව වලනය නොවන හා වසර දෙකකට වඩා පැරණි රු.4,752,220 ක් වටිනා නිම් තේ තොගයක් තොග ශේෂයෙහි ඇතුළත්ව තිබුණද, මූල්‍ය ප්‍රකාශන තුළ ඒ සඳහා කිසිදු වෙන්කිරීමක් කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ තොග අගය වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

ප්‍රමිතියේ ඡේද අංක 03 ප්‍රකාරව කෘෂිකාර්මික කටයුතුවලට අදාළ රු.592,472,216 ක් වූ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ,-පිරියත හා උපකරණ යටතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කළයුතු වුවද, ජීව වත්කම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 17

මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.32,168,955 ක වටිනාකමින් පුන් කල්බදු වත්කම් ප්‍රමාණයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ නිරූපණය කර ඇතත්, ප්‍රමිතියේ 47 ඡේදය ප්‍රකාරව වත්කම හිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19

ප්‍රමිතියේ ඡේද අංක 57 ප්‍රකාරව දස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැදීම් ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු අතර, ඒ සඳහා වර්තමාන සේවා පිරිවැය සේවකයින්ගේ වයස් ප්‍රමාණය, සේවකයින්ගේ ආයු අපේක්ෂාය, සේවා පිරිවැටුමට වූ බලපෑම්, විශ්‍රාම වයස, වට්ටම් අනුපාතය, වැටුප් හා වර්ධන ප්‍රතිශතය වැනි උපකල්පන යොදා ගත යුතුවේ. එහෙත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සිය ප්‍රතිලාභ ගණනයේදී ඉහත ආයුගණන ක්‍රමය යොදා ගෙන නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41

(i) ඉඟුරු, කොකෝවා හා කෙසෙල් වගාවන් ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වුවත්, මණ්ඩලය විසින් රු.283,321 ක් වටිනා එවැනි වත්කම් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) 12 වැනි ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස මැණිය නොහැකි නම් හැර ජීව විද්‍යාත්මක වත්කමක් මූලික හඳුනා ගැනීමේ සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් පිරිවැය සඳහා අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැණිම් කර ගිණුම් ගත කළ යුතු වුවත්, මණ්ඩලය විසින් දැව වටිනාකම් සහිත ගස් 60,000 කට අධික ප්‍රමාණයක් මේ වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්ති අනුව පරිනත නොවූ, තේ හා රබර් වගාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය පරිනත වූ වගාව වෙත මාරු කරනු ලබන කාලය නිශ්චිතව දක්වා තිබුණද, කොකෝවා, කෝපි, කුරුඳු, කරදමුංගු, පාදික්කා, පුවක් ,පොල් හා ගම්මිරිස් යන වගාවන්වල පරිනත කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් එම වගාවන් පරිනත වීමට පෙර දරන ලද රු. 8,639,177 ක වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වර්ෂය හඳුනාගත නොහැකි වී තිබුණි.

3.2.4 නිකුත් කරන ලද පැහැදිලි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොලපතන වත්තට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 2,209,960 ක් වූ පාරිතෝෂික අධිභාර මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2017 අගෝස්තු 17 දිනැති අංක 483516 දරන චෙක්පත මඟින් නඩු තීන්දුවකට අනුව ගෙවන ලද කුමාරවත්ත වතුයායට අයත් රු.346,767 ක පාරිතෝෂික මුදල්, වියදමත් ලෙස වතු ගිණුම් වල වාර්තා කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ජන තේ අංශයේ රු. 1,833,254 ක කාලය ඉකුත් වූ තේ තොගයක් පවතින අතර මෙම තොග ගිණුම් තුළින් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එකතුව රු. 2,411,964 ක කල් ඉකුත් වී ඇති ජන තේ අංශයේ තේ සහ පැරණි තේ පැළ තවාන් තොග මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ අනාවරණය කිරීම නිසා එම ප්‍රමාණයෙන් මණ්ඩලයේ අලාභය ඌන ගණනය වී තිබුණු අතර වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ආදායම රු.42,863,392 ක් වූ නමුත් ජාතිය ගොඩනැගිමේ බදු වාර්තා අනුව එය රු.17,984,651 ක් වී තිබුණි. ඒ අනුව 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනතේ 3 (2) (iii) අනුව උපචිත පදනම වෙනුවට මුදල් පදනම සැලකිල්ලට ගැනීම නිසා ජාතිය ගොඩනැගිමේ බදු රු.497,574 කින් අවතක්සේරු වී තිබුණි.

(ඊ) වතුයායන් විසින් ඉර්ෂ කිහිපයකට පෙර සිට පංචර්ධන වැඩ සහ වගා කටයුතු සඳහා දරා ඇති රු.1,619,020 ක වියදම්වල නිමවීමේ ප්‍රගතිය වාර්තාකර නොතිබුණු අතර මේ නිසා මෙම වත්කම්වල පිරිවැය ප්‍රාග්ධනිත කිරීම හෝ කපා හැරීම පිදු නොකර සමාලෝචිත වර්ෂයේ එම අගයම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ කෙරිගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැය ගිණුමෙන් ප්‍රාග්ධනිත කළ යුතු වටිනාකම රු.219,426 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ වල පිරිවැයෙන් රු.1,043,863 ක් පදොස් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ කල්බදු පහසුකම යටතේ මිලට ගත් ලොරි රථ 04 ක කල්බදු වගකීම් ලෙස රු.6,840.071 ක වටිනාකමක් දක්වා තිබුණද,

නල්බදු ගිවිසුම් වලට අනුව විගණනය විසින් කරන ලද ස්වාධීන ගණනය කිරීම් අනුව නල්බදු වගකීම් රු.5,984,770 ක් ලෙස නිරීක්ෂණය වූයෙන්, නල්බදු වගකීම් රු.855,301 කින් අඩුකක්සේරු වී තිබුණි.

(ඇ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඊ.එම්.ඒ.ඉන්ෆෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ් ලෙස රු.1,171,863 ක නල්බදු වගකීමක් දක්වා තිබුණද, නල්බදු ගිවිසුම අනුව කරන ලද ස්වාධීන ගණනය කිරීම අනුව 2017 දෙසැම්බර් 31 දිනට නල්බදු වගකීම රු.1,702,400 ක් වූයෙන් නල්බදු වගකීම් ගිණුම රු.530,537 කින් ඌන තක්සේරු වී තිබුණි.

(ඒ) 2017 පෙබරවාරි 18 වන දින ලැබී තිබූ තක්සේරුවකට අනුව, 2016 ජනවාරි 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව එකතු කළ අගය මත බදු මුදල් හා දඩ මුදලේ එකතුව වූ රු.342,365 ක් ගිණුම් ගත නොකිරීම නිසා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු එම ප්‍රමාණයෙන් ඌන තක්සේරු වී තිබුණි.

(ඕ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම සඳහා දරන ලද වියදම රු. 6,919,465 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කිරීමේදී දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම් සඳහා දරන ලද වියදම රු.5,875,600 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,043,865 ක් වූ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමේ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීම් කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී පාරිතෝෂික ගෙවීම් ලෙස කිසිදු අගයක් ගැලපීම් කර නොමැති නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම වගකීම් වල දක්වා ඇති ගෙවිය යුතු පාරිතෝෂික දීමනාව රු.25,532,828 කින් අඩු වී තිබුණි.

(ක) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ වාහන විකුණුම් ආදායම් ගිණුමේ රු.6,927,078 ක ආරම්භක ශේෂයක් පැවති අතර, එය 2017 දෙසැම්බර් 31 දින ජ'නල් සටහනක් මගින් විශ්ලේෂණයකින් තොරව රදවා ගත් ඉපයුම් වලට මාරුකර තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය සතු වාහන 18 ක් රු. 5,025,000 කට විකුණා දැතත් එම වාහන වල පිරිවැය හා ගිණුම්කරණ ක්ෂය වාහන විකුණුම් ආදායම් ගිණුමට මාරුකර නොතිබුණු අතර, මේ නිසා වාහන වල පිරිවැය හා ක්ෂය වෙන් කිරීම් අඩි ගණනය වී තිබුණි.

(ඇ) [illegible] විෂය පථයට ඇතුළත් කිරීමේ හේතුවෙන් වාර්තාවට ඇතුළත් කළ යුතු වත්කම් අතර සිදු කළ වෙනස්කම් හේතුවෙන් වාර්තාවට ඇතුළත් කළ යුතු වත්කම් අතර

2.2.5 නොසැපුදු පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව පමාලෝචිත වර්ෂය අවසාන දිනට ප්‍රධාන කාර්යාලය යටතේ වෙළඳ ගෙවිය යුතු ශේෂය රු.275,108,425 ක් වුවද, ණයගිමි කාල විශ්ලේෂණ අනුව එම ශේෂය රු.118,866,992 ක් වීම හේතුවෙන් එම ශේෂයන් අතර රු. 156,241,433 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි වෙළඳ ගෙවිය යුතු ශේෂය රු.241,038,504 ක් වුවද, ණයගිමි වයස් විශ්ලේෂණය අනුව එම ශේෂය රු. 50,765,175 ක් වූයෙන් රු.190,273,329 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය අතර, සිදුවන භාණ්ඩ හුවමාරු කිරීමට අදාළව පවත්වාගෙන යනු ලබන වතු පාලන ගිණුම්වල හර සහ බැර ශේෂයන් අතර, නොසැසඳුණු රු. 2,183,955 ක බැර ශේෂයක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද වතු ගිණුම් අනුව ගෙවිය යුතු පාරිතෝෂික හා අධිභාර ශේෂ, විගණනය සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද උපලේඛනයේ ඇතුළත් ශේෂ සමග සැසඳීමේදී පිළිවෙලින් රු.36,697,576 ක් හා රු.242,693 ක් වශයෙන් එකතුව රු. 36,940,269 ක් වූ වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ හා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදලේ ශේෂ වල එකතුව රු.774,599,467 ක් වූ අතර, විගණනයේදී ලබා ගත් උපලේඛන අනුව එම ශේෂවල එකතුව රු.791,665,849 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන්ගේ අගයන් අතර රු.17,066,382 ක වෙනසක් පවත්නා බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනීත කරන ලද රු.25,410,852 ක පරිනත රබර් වගාව එම වතුයායේ මාසික ගිණුම් අනුව රු.26,089,144 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වටිනාකම් අඩු රු.678,292 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවා නියුක්තිකයන්ගේ අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු අධිභාර වටිනාකම රු.2,250,905 ක් වූ අතර, විගණනයේදී ලබාගත් උපලේඛන අනුව 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 27

[illegible] අනුව විගණනය විසින් කරන ලද ඇස්තමේන්තු රු. 18,514,235 ක් විය. ඒ අනුව සමාලෝචන වසරේ අවසාන නිශ්චිත අනුව ගෙවීම්වලින් වැටිකිරීම් හා විගණනයේ ගණනය කිරීම් අතර රු.16,263,330 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් ගෙවිය යුතු අධිභාර වටිනාකම රු.28,573,486 ක් වූ අතර විගණනයේදී ලද තොරතුරු පදනම් කරගෙන 1958 අංක 15 දරන සේවා නියුක්තිකයන්ගේ හාර අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව විගණනය විසින් ගණනය කරන ලද අධිභාර වටිනාකම රු.358,362,261 ක් විය. ඒ අනුව රු. 329,788,775 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මණ්ඩලය විසින් ශේෂ පනාඵන ලිපි කැඳවා තිබුණු ණයගැතියන් දස දෙනෙකුගෙන් පස් දෙනෙකු පමණක් අදාළ ලිපිවලට ප්‍රතිචාර දක්වා ශේෂයන් පනාඵ කර තිබුණු අතර, ශේෂ පනාඵන ලිපි අනුව එකතුව රු.8,890,102 ක ණයගැති ශේෂ 3 ක් සඳහා අදාළ ආයතන එකඟ නොවන බවත්, තවත් ආයතන දෙකක රු. 29,175,256 ක් අඩුවෙන් ශේෂ පනාඵ කර එවීම නිසා රු.38,065,358 ක ණයගැති ශේෂ වල පැවැත්ම මතභේදාත්මක බව නිරීක්ෂණය කෙරේ.

(ඒ) එකතු කළ අගය මත බදු වාර්තා අනුව පිරිවැටුම රු.17,242,695 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැටුම රු.1,174,785,678 ක් වශයෙන් නිරීක්ෂණය වූයෙන් එකතු කළ අගය මත බදු වාර්තා අනුව පිරිවැටුම හා මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැටුම අතර, රු.1,157,542,983 ක වෙනසක් පැවතුණි.

(ඔ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා ඇති, පරිනත තේ වගාවන්ට අදාළ ක්‍රමක්ෂය වටිනාකම ලෙස රු.10,000,000 ක් ගැලපීම් කර තිබුණද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව ගණනය කරන ලද ක්‍රමක්ෂය වටිනාකම රු. 12,192,800 ක් වූයෙන් ක්‍රමක්ෂයවල රු.2,192,800 ක වෙනසක් නිරීක්ෂණය කෙරේ.

(ඕ) රබර් වගාවට අදාළව ගිණුම්ගත කළ ක්‍රමක්ෂය වටිනාකම රු.14,340,262 ක් වූවද, ස්ථාවර වත්කම් උපලේඛනය අනුව ක්‍රමක්ෂය වටිනාකම රු.6,358,559 ක් වූයෙන් රු.7,981,703 ක වෙනසක් නිරීක්ෂණය කෙරේ.

2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත පදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නුවර - ප්‍රාදේශීය වතු කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය අතර සිදු කරනු ලබන ගනුදෙණු වාර්තා කරනු ලබන ගිණුම තුළ සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 13,828,888 ක බැර ශේෂයක් පැවතී අතර, එය වෙළඳ ගෙවිය යුතු දෑ තුළ දැතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ජන තේ අංශයේ වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂයේ වටිනාකම වූ රු.5,393,358 කින් සියයට 97 ක්, එනම් රු. 5,278,648 ක අයවිය යුතු ශේෂ වසර 5 ට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර, එම ශේෂ අයකර ගැනීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) මණ්ඩලයේ දින 90 ත් දින 781 ත් අතර කාල පරාසයක පැරණි අයනොවී පවතින සහ සෙමින් අයවන එකතුව රු.64,232,303 ක ණයගැති ශේෂ 287 ක් අයකර ගැනීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඈ) 1999 වර්ෂයට පෙර සිට පැවත එන රු.3,197,506 ක වතු ගිණුම් ශේෂයන් සමාලෝචිත වර්ෂයේද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇතත් එයට අදාළ වත්කම නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ඉ) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වතුයායන් විසින් ආරම්භ කරන ලද ඇට තේ සහ රිකිලි තේ පැළ තවාන් සඳහා දරන ලද රු.590,530 ක වියදම් ඉන් වර්ෂ ගණනාවකට පසුවද ප්‍රාග්ධනිත කර හෝ කපා නොහැර කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ වශයෙන් දක්වා තිබීමට හේතුව පැහැදිලි කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවිය යුතු ශේෂය රු.18,457,480 ක් වුවද, වැවිලි මානව සංවර්ධන භාරය මඟින් සිදුකළ ශේෂ සනාථනය අනුව එම ශේෂය රු.24,775,454 ක් වූයෙන් එම ශේෂ අතර රු.6,317,974 ක නොසැසඳූ වෙනසක් පැවතුණි.

(උ) වතුයායන් පහක පිරිවැය රු.47,110,733 ක පරිනත නොවූ තේ වගාවක් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුනද, වයස් විශ්ලේෂණයන් අනුව එම වතුයායන්හි පරිනත නොවූ තේ වගාවන් නොමැති බව නිරීක්ෂණය වූයෙන්, ගිණුම් අනුව පරිනත නොවූ තේ වගාවන් ලෙස දැක්වෙන ශේෂය පිළිගැනීමට හෝ ඒ පිළිබඳව සැහීමකට පත්විය නොහැකිව පැත.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය ඉදිරිපත් කළ ණයගැති වයස් විශ්ලේෂණයට අනුව එපර පහ ඉක්මවූ ණයගැති ශේෂය රු. 103,753,900 ක් විය. මෙම ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. එම ශේෂය මණ්ඩලය විසින් ණයගැති කාල විශ්ලේෂණය ඉදිරිපත් කළ ණයගැතියන්ගෙන් සියයට 87 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වර්ෂ 01 ත් වර්ෂ 04 අතර පවතින හිඟ වරිපනම් ශේෂය රු.11,289,205 වූ අතර, වර්ෂ 05 ඉක්මවූ හිඟ වරිපනම් ශේෂය රු.32,422,084 විය. ඒ අනුව වර්ෂ 05 ඉක්ම වූ හිඟ වරිපනම් ශේෂය මුළු හිඟ වරිපනම් ශේෂයෙන් සියයට 74 විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ද මණ්ඩලය විසින් මෙම හිඟ වරිපනම් පියවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ වතුයායන්ට අදාළව රු. 1,116,571 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂයන් 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ පැරණි ඒවා වුවද, එම ණය ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදීද ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) තේ දළු ණය පදනම මත අලෙවි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 32,138,382 ක ණයගැති ශේෂයක් පවතිනු අතර, ඉන් රු.28,183,139 ක් වූ තේ දළු ණයගැතියන් 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරාසයකට අයත් වන නමුත් මෙම පැරණි ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 1999 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරාසයක සිට පැවත එන රු.4,008,885 ක් වූ වතුයායන් හතකට අදාළ පැරණි ණයගැති ශේෂයන් 33ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රංශුම වත්කම් යටතේ දනාවරණය කර දැති අතර, එම ශේෂ අය කර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ.

2.2.3 විගණනය සඳහා ප්‍රාප්ති නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපෘති සම්පත් කළමනාකරණ සංස්ථාව, හලාවත වැවිලි සමාගම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ලංකා ඛනිජ වැලි සමාගම හා ලංකා සෙරමික් සංස්ථාව යන ආයතන 4 කින් ලබාගත්නා ලද රු.176,571,131 ක ණය මුදල් පිළිබඳව ශේෂ සනාථන ලිපි හෝ ණය ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතු 17 ක් සඳහා පාරිතෝෂික වෙන් කිරීම් හා පාරිතෝෂික ගෙවීම් පිළිබඳ විස්තර ඇතුළත් විස්තරාත්මක සේවක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.13,011,262 ක් වූ බැංකු ජංගම ගිණුම් ශේෂයන් 6 ක් සඳහා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) වටිනාකම රු.7,687,170 ක් වූ කල්බදු පදනම මත ලබාගත් ලොරි 04 ක් හා කවත් වත්කම් සඳහා කල්බදු වගකීම් අදාළ මූල්‍ය ආයතන විසින් සනාථ කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ පෙන්වන එකතු කළ අගය මත බදු රු.51,205,999 කට අදාළ බදු වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) එකතු කළ අගය මත බදු රු.9,788,022 ක ආරම්භක ගෙවිය යුතු ලෙජර ශේෂය හා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය එකතු කළ අගය මත බදු මුදල වන රු.3,521,614 ක ශේෂය සනාථ කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ (සංශෝධිත) 26 වගන්තිය ප්‍රකාරව සෑම මාසයක් පදහාම ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ඊළඟ මාසයේ 20 වන දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත්, එකතු කළ අගය මත බදු සටහන් අනුව ගෙවිය යුතු රු.2,264,172 ක බදු මුදල් පවතින උග්‍ර මූල්‍ය අර්බුදය නිසා යැයි කරුණු දක්වමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) 2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පැවත එන රු. 6,410,514 ක් වටිනා පැරණි රබර් තොගයක භෞතික පැවැත්ම නහවුරු කෙරෙන කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැංකු ණය ලෙස දක්වා ඇති රු.55,506,609 තුළ අන්තර්ගත වන , මහජන බැංකුවෙන් ලබාගෙන ඇති රු. 22,970,327 ක ණය ශේෂය 2017 ජනවාරි 01 දින පැවති ආරම්භක ශේෂයම වන අතර, මෙම ණය මුදල සනාථ කිරීමට ශේෂ සනාථන ලිපියක්, ණය ගිවිසුමක් හෝ ඒ පිළිබඳ වෙනත් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) වර්ෂය තුළදී විකුණන ලද වාහන 18 කට අදාළව පිරිවැය හා ක්ෂය හදුනාගෙන අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

(ඔ) මණ්ඩලයේ වතු ඉඟුම්වල වසර 1 ත් වසර 16 ක් දක්වා පැරණි රු. 1,116,571 ක් වටිනා උත්පව අත්තිකාරම් ශේෂයන් පැවතියද එම ශේෂ හිමි නිලධාරීන් හදුනාගත නොහැකිව තිබුණි.

(ඕ) ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර ඇති තොග ශේෂයේ ඇතුළත් රු.43,690,535 ක් වටිනා නිම් තේ තොගය හා රු. 11,520,815ක් වටිනා රබර් තොගය සම්බන්ධයෙන් භෞතික තොග සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස රු.57,987,031 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ඉඟුම්ගත කර තිබුණමුත් එයට අදාළ තැන්පත්කරුවන්ගේ නාම ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ග) වර්ෂ ගණනාවකට පෙර සිට පැවත එන එකතුව රු. 5,444,530 ක් වූ වෙළඳ ගෙවිය යුතු ශේෂයන් ඊ5 කට අදාළ ණයහිමි ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇති වතුයායන්හි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වූ රු.63,882,700 ක ශේෂය සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ජ) මණ්ඩලයේ අවසන් ඉඟුම් තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ ජන තේ අංශයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය වූ රු. 3,487,070 ක වටිනාකම සහ රු. 291,579 ක් වූ ප්‍රාදේශීය කාර්යාලය ශේෂ (අවිනිශ්චිත ශේෂ) සහ විවිධ ණය හිමි ශේෂය 2015

වර්ෂයට පෙර සිට පැවත එමින් තිබුණු අතර, එම වටිනාකම් නිර්මාණය වූ ආකාරය සහ ශේෂ නහවුරු කර ගැනීමට අවශ්‍ය කිසිදු ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ට) මණ්ඩලයේ වතුයායන්වල ප්‍රධාන කාර්යාලයේ සහ ජන තේ අංශයේ පවතින රු. 53,173,699 ක වෙළඳ ගෙවිය යුතු ශේෂය සනාථ කර ගැනීම සඳහා විගණිත දිනය වන 2021 පෙබරවාරි 23 දින වන විටත් කැදවා තිබුණු ශේෂ සනාථනයන් ලැබී නොතිබූ අතර රු.46,019,100 ක් සඳහා පසුකාලීන නිරවුල් කිරීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන්ගේ පැවැත්ම පිළිබඳ සැහීමකට පත්විය නොහැකි වී තිබුණි.

(ඩ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ප්‍රධාන කාර්යාලීය ජන තේ අංශය තුළ පවතින රු.669,161 ක තැන්පතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ණ) තොග ශේෂය තුළ ඇති රු.1,613,875 ක් වූ තේ හා රු. 109,143 ක් වටිනා පැරණි රබර් තොග සෘණ ශේෂ බවට පත් වූ ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් සිදුකර නොතිබුණි.

(ත) වර්ෂ දහයකටත් පෙර සිට පැවත එන එකතුව රු. 192,483,366 ක ශේෂ හතරක් හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ද) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ වෙන් කරන ලද පාරිතෝෂික ප්‍රතිපාදනය සහ වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික දීමනා පිළිබඳ ව මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ බදු පෙර ලාභයට ගැලපීම් කර ඇති රු.29,610,941 ක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ නිවැරදිතාවය තහවුරු කරගැනීමට අවශ්‍ය උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

[illegible] නීති විති, රෙගුලාසිවලට පොළුව අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති විති, රෙගුලාසිවලට පොළුව	අනුකූල නොවීම
(අ)	2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට ඳදාළ වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2020 සැප්තැම්බර් 10 දින වන අතර, මෙ වන විට ගිණුම් ඉදිරිපත් කළ යුතු කාලය වර්ෂ 2 ½ කින් ඉක්ම ගොස් තිබුණි.
(ආ)	මූ. රෙ. 395 (ආ)	මණ්ඩලය විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු අතර, එය ගෙවන නිලධාරියා විසින් සහතික කොට විගණකාධිපති වෙත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, බැංකු ගිණුම් 07 ක් සඳහා සැසඳුම් ප්‍රකාශ සහතික නොකර විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.
(ඇ)	මූ.රෙ. 395 (ඇ)	එක් එක් මාසයක් අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් මාසයේ 15 දිනට ප්‍රථම බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වුවද, බැංකු ගිණුම් 05 ක් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.
(ඈ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ (4) (1) වන උප වගන්තිය	මණ්ඩලය විසින් පාරිතෝෂික මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2017 වර්ෂය අවසාන වන විට රු. 124,734,142 ක මුදලක් අධිභාර ලෙස ගෙවිය යුතුව තිබෙන බව නිරීක්ෂණය විය.
(ඉ)	1958 අංක 15 දරන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල් පනත	සේවක අර්ථසාධක අරමුදල් සමාලෝචිත වර්ෂයේ නිපි පරිදි අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් 2001 වර්ෂයේ පිට වර්ෂ 16ක කාලයක පිට නොගෙවූ රු.749,582,376 ක හිඟ ශේෂයක් පවත්නා බව විගණනයේදී අනාවරණය විය.
(ඊ)	1958 අංක 15 දරන සේවා නියුක්තිකයන්ගේ අරමුදල් පනත, එම පනතේ ප්‍රතිපාදන අනුව	ප්‍රධාන කාර්යාලයේ 2006 වර්ෂයේ පිට 2017 අගෝස්තු මාසය දක්වා අර්ථසාධක අරමුදල් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ ගණනය කිරීම් සඳහා

	පිහිටුවා ඇති විනුකාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත	ජීවිත වියදම් දිමනාවද ඇතුළත් "මුළු ඉපයීම්" අදාළ කර ගෙන නොතිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා රු. 21,621,966 ක මුදලක් සේවක සේවා දායකත්වය සඳහා කම්කරු කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණු බව විගණනයට සපයන ලද උපලේඛන අනුව තහවුරු විය.
(උ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16(1) උපවගන්තිය	සේවානියුක්තිකයා උපයන මුළු ඉපයීම් වලින් සියයට 3ක වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර ඒ සේවානියුක්තිකයා සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට සේවා යෝජකයා යටත් විය යුතු නමුත් සේවක භාරකාර අරමුදලේ දායකත්වය සමාලෝචිත වර්ෂයේ නිසි පරිදි ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට වර්ෂ 7ක කාලයක සිට නොගෙවූ රු.42,082,874.32 ක හිඟ ශේෂයක් පැවතුණි.
(ඌ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 113 වගන්තිය	පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ස්වයං තක්සේරු පදනම මත ව්‍යාපාරය අලාභ ලැබුවද, බදු කටයුතු අනුව බදු ලාභයක් හෝ අලාභයක් ලැබිය හැකි නිසා බදු කටයුතු අනුව ලාභය හෝ අලාභය ගණනය කර කාර්තුවක් අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2017 තක්සේරු වර්ෂයට අදාළව එසේ වාර්තා කර නොතිබුණි.
(එ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 106 වගන්තිය	ආදායම් බදු වාර්තාව ඊළඟ වර්ෂයේ නොවැම්බර් 30 හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු වුවත් මණ්ඩලය විසින් 2017 තක්සේරු වර්ෂයකට අදාළ 2017/2018 ආදායම් බදු වාර්තාව 2021/03/03 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට භාර දී නොතිබුණි.
(ඒ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ (සංශෝධිත) 21 (1) වගන්තිය	එකතු කළ අගය මත බදු වාර්තා අදාළ උපලේඛන සමඟ කාර්තුවේ ඊළඟ මස අවසන් දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද එකතු කළ අගය මත බදු වාර්තා මණ්ඩලය විසින් ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි.

2012 ජූනි 14 වන දින එකතු කළ වටිනාකම් මත බදු පනතේ (එකතු කළ වටිනාකම් මත බදු) පනතේ උපලේඛන 08 වන පළමු කොටසේ II වන කොටසෙහි (PART II) XLVII

බදුදෙන් නිදහස් විකුණුම් (Exempt Supplies) යටතේ පෙන්වා නොතිබුණි.

(ඌ) ජාතිය ගොඩනැගීමේ බදු පනතේ උපලේඛන 04

2017 වර්ෂයේ බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දීමේදී පනතේ සඳහන් නිශ්චිත දිනයට හෝ ඊට පෙර භාරදීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ක) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 06 වන උපලේඛනය

බද්දට යටත් පිරිවැටුම් ඉක්මවන සෑම ආයතනයක්ම කාර්තුව අවසන් වී එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වුවත් මණ්ඩලය 2012 වර්ෂයේ සිට 2019 මූල්‍ය වර්ෂය දක්වා වාර්තා භාර දීම හෝ ගාස්තු ගෙවීමක් සිදු කොට නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.381,022,523 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.563,961,014 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.182,938,491 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ නිමි තේ සහ රබර් ආදායම පිළිවෙලින් රු.318,416,415 ක් හා රු.127,883,389 කින් වැඩි වීම ඉහත අලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක වුලය සමාලෝචනය

අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

	2017	2016
දළ ලාභ (අලාභ) අනුපාතය (සියයට)	(21)	(81)
ශුද්ධ ලාභ (අලාභ) අනුපාතය (සියයට)	(35)	(114)
ජංගම අනුපාතය	0.33: 1	0.27:1
ක්ෂණික අනුපාතය	0.29:1	0.23:1

පහත නිරීක්ෂණ ඉදිරිපත්කෙරේ.

සමාලෝචිත වර්ෂයේදී පාරිභෝජ්‍ය තේ ආදායම හා රබර් ආදායම පිළිවෙලින් රු. 116,522,744 කින් හා 127,883,388 කින් පෙර වර්ෂයට වඩා වැඩි වී තිබුණි. මෙම ආදායම් දෙකෙහි වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 51ක් වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 අනාර්ථික ගනුදෙනු

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා සේවා අර්ථසාධක අරමුදල වෙත නිසි පරිදි දායක මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.2,250,905 ක් හා රු.28,573,486 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2017

විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතනය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

	විමසුම්/අඩුපාඩු	නිවැරදි කිරීම
1.	මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය අනුව රු. 32,168,955/- ක වටිනාකමකින් යුත් කල්බදු වත්කම් ප්‍රමාණයක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුල නිරූපනය කර ඇතත් ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව වත්කම් පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශය තුල සිදු කර නොතිබුනි.	2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව රු. 32,168,955/- ක වටිනාකමකින් යුතු කල්බදු වත්කම් ප්‍රමාණය ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව වත්කම් පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් 2019 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුලින් සිදු කර ඇත.
2.	කොලපතන වත්තට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 2,209,960/- ක් වූ පාරිතෝෂික මුදල ගිණුම්ගත කර නොතිබුනි.	කොලපතන වතුයායේ 2017 වර්ෂයට අදාළ ගෙවිය යුතු පාරිතෝෂික අධිභාර මුදල වන රු. 2,209,960/- 2018 වර්ෂයේ වතුයායේ ගිණුම් තුළින් පෙන්වා ඇත.
3.	රබර් වගාවට අදාළව ගිණුම්ගත කල ක්‍රම ක්ෂය වටිනාකම රු. 14,340,262/- ක් වුවද ස්ථාවර වත්කම් උප ලේඛනය අනුව ක්‍රම ක්ෂය වටිනාකම රු. 6,358,559/- ක් වුයෙන් රු. 7,981,703/- ක වෙනසක් නිරීක්ෂණය කෙරේ.	රබර් වගාවට අදාළව 2017 වර්ෂයේ අවසන් ගිණුම් අනුව ක්ෂය ප්‍රමාණය රු.14,340,262/- ක් විය යුතු නමුත් උප ලේඛන අනුව එම ක්ෂය ප්‍රමාණය රු. 6,362,021/- ලෙස දක්වා ඇත. (කුමාරවත්ත රු.5,091,479/- සහ දියළුම රු. 1,270,542/-) එසේම ඉහත කරුණු අනුව රු.7,978.241/- ක් වූ අධිගහනය කර ඇති එම ක්ෂය ප්‍රමාණය 2018 වර්ෂයේ ගිණුම් තුලින් නිවැරදි කර ඇත.
4.	සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය ඉදිරිපත් කල ණය හිමි වයස විශ්ලේෂණය අනුව වසර 05 ක් ඉක්ම වූ ණය හිමි ශේෂය රු. 103,753,900/- ක් විය. මෙම ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුනි. එම ශේෂය මණ්ඩලය විසින් ණය හිමි කාල විශ්ලේෂණය ඉදිරිපත් කල ණය හිමියන්ගෙන් 87% ක් විය.	මෙම විමසුමට අනුව දීර්ඝ කාලයක සිට ප්‍රධාන කාර්යාලයේ එනම් වසර 05 ඉක්මවූ ණය හිමි ශේෂයන් මෙම රු. 103,753,900/- ක වටිනාකමට ඇතුලත්ය.ආයතනයේ දැනට පැවති හා පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන ගෙවීම් කටයුතු කිරීමට නොහැකි වීඇත. කෙසේ වෙතත් මූල්‍ය තත්වය යහපත් වූ විට අවශ්‍ය ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.
5.	මණ්ඩලයේ වතුයායන්ට අදාළව රු.1,116,571/- ක් වූ උත්සව අත්තිකාරම් ශේෂයත් 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ පැරණි ඒවා වුවද එම ණය ශේෂ අය කර ගැනීමට මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි.	මෙම කාල සීමාව තුල සේවකයින් මියයාම,සේවයෙන් පහ කිරීම්, සේවය අත හැර යාම ආදී කරුණු නිසා උත්සව අත්තිකාරම් අය කර ගැනීමට නොහැකි බව වතුයායම පවසයි. කෙසේ වෙතත් මෙසේ ඉවත් වූ සේවකයින් අර්ථසාධක අරමුදල් හා පාරිතෝෂික දීමනා ලබා ගැනීමට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා වතුයායන් වෙත පැමිණෙන අවස්ථා වලදී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

6.	රාජ්‍ය ව්‍යවසාය සම්පත් කළමනාකරණ සංස්ථාව, හලාවත වැවිලි සමාගම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ලංකා බනිජ වැලි සමාගම සහ ලංකා සෙරමික් සංස්ථාව යන ආයතන 4 න් ලබා ගන්නා ලද රු.176,571,131/- ක ණය මුදල පිළිබඳ ශේෂ සනාතන ලිපි හෝ ණය ගිවිසම් විගණනයට ඉදිරිපත් කර නොතිබුනි.	හලාවත වැවිලි සමාගම 2017 වර්ෂය සඳහා ශේෂ සනාථ ලිපි ඉදිරිපත් කර ඇත.ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ලංකා බනිජ වැලි සමාගම 2017 වර්ෂය සඳහා ශේෂ සනාථ ලිපි ඉදිරිපත් කර ඇත.
7.	ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර ඇති තොග ශේෂයේ ඇත්ළත් රු. 43,690,535/- ක් වටිනා නිමි තේ තොගය හා රු. 11,520,815/- ක් වටිනා රබර් තොගය සම්බන්ධයෙන් භෞතික තොග සත්‍යාපනයක් සිදු කර නොතිබුනි.	තේ හා රබර් කර්මාන්ත ශාලා වලින් නිෂ්පාදන කටයුතු අවසන් වීමත් සමගම එම තොග ඉන්වොයිස් මගින් තැරැව්කාර සමාගම් වලට යවනු ලබයි. එහෙයින් පිටස්තර ගබඩා සංකීර්ණයන්හිදී තොග ගණනය කිරීමක් අප විසින් සිදු නොකරන අතර සියළු තොග විකිණීම් වලට අදාළ සටහන් තබනු ලබන Crop ledger ප්‍රධාන කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලබයි.